[illegible]

COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION

[illegible]

[illegible] 2022.04.15 [illegible]

02. [illegible] B.B. 1528/2014 [illegible]

[illegible]

Add Doc.
N.A.P.

නියාමන වාර්තාවේ නිර්දේශ:-
එහෙමත් සිදුවූ තවම කිසිදු ආගමනක් නොමැත

හයවෙනි පරිච්ඡේදය

නිර්දේශ

6.1 අරමුදලේ පාලක මණ්ඩල සංයුතිය සියළු ආගම් නියෝජනය වන පරිදි සකස් විය යුතුද යන්න සහ මණ්ඩලය කාලීනව රැස්වීම හා කළමනාකරණ තීරණ කඩිනමින් ගැනීමට ක්‍රියාකළ යුතුවීම සඳහා අරමුදල පනත සුදුසු පරිදි සංශෝධනය කිරීම පිළිබඳව අවධානය යොමු කලයුතුය. (යොමුව : 2.1.2.7 )

6.2 අරමුදලේ සියළු අංශ ආවරණය වන පරිදි මණ්ඩලයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැසුම් තාත්වික අයුරින් පිළියෙල කළයුතු වීම සහ ඉලක්කගත කාල පරිච්ඡේදය තුල ඉලක්ක කරා ළඟාවීමට ක්‍රියාකළ යුතුවීම. (යොමුව : 5.1.1 , 5.1.16 )

6.3 පනතේ සඳහන් කර ඇති පරිදි අරමුදලේ ක්‍රියාකාරිත්වය හා සම්බන්ධ සියළු කාරණාවලට රීති සැදීමට කඩිනමින් ක්‍රියකළයුතු වීම. (යොමුව:2.1.6.4, 3.8 )

6.4 අරමුදලේ මුළු වියදම තුළ වැඩි ප්‍රතිශතයක් සේවක පිරිවැය නියෝජනය වී තිබීම පිළිබඳව සහ සංරක්ෂණ වැනි කාර්ය සාධන කටයුතු සඳහා වැඩි දායකත්වයක් නොතිබීම පිළිබඳ අවධානය යොමු කර සුදුසු පියවර ගත යුතු වීමත්, සංස්කෘතික උරුම ස්ථාන සංරක්ෂණය සඳහා වැඩි අවධානයක් යොමු කළයුතු වීම (යොමුව :2.1.8.5 )

6.5 අරමුදල පනතේ සඳහන් විධිවිධානයන්ට අනුව ප්‍රවේශපත් ගාස්තු අයකිරීම සහ මුදල් ආයෝජනය කිරීම සහ ආයෝජන මුදල් ආපසු ගැනීම හැකිතාක් පූර්ව අනුමැතිය මත කලයුතු වීම. (යොමුව :2.1.7.1,3.1.3,3.1.5,3.1.6 )

6.6 ගෙවීම් කිරීමේ දී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයට හා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේදී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට සහ රාජ්‍ය පරිපාලන, කළමණාකරන සේවා චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කලයුතු වීම. (යොමුව : 3.2.1.16, 3.2.1.18, 4.1.3, 4.1.4, 4.1.7 )

6.7 කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි සංශෝධනය කිරීමට කඩිනමින් ක්‍රියා කළ යුතු වීම, අරමුදල සමඟ කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ දී නිවැරදි අවශ්‍යතාවය හඳුනාගෙන බඳවා ගැනීම සහ අරමුදලේ ජ්‍යෙෂ්ඨ මට්ටම සඳහා ස්ථිර පදනම මත සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලය බඳවා ගැනීම පිළිබඳ අවධානය යොමුකළ යුතුවීම. (යොමුව : 4.1.3, 4.1.8,4.1.6 )

6.8 අරමුදලේ බඳවාගැනීම් පටිපාටියට සහ අනුමත කාර්ය මණ්ඩල සංයුතියට පටහැනිව පාලක මණ්ඩල අනුමැතිය මත අවිධිමත් ලෙස කාර්ය මණ්ඩලය බඳවා ගැනීමෙන්

වැළැක්වීම සහ වෙනත් ආයතන වෙනුවෙන් සේවය සැපයීම වෙනුවෙන් අරමුදලට කාර්ය මණ්ඩල බඳවා ගැනීමෙන් වැළකිය යුතුවීම. (යොමුව :5.5.4.1)

6.9 වියදම් අවශ්‍යතාවයන් ඉක්මවා යන පරිදි ආයෝජන ආපසු ලබා ගැනීම වැළැක්වීම සහ එපරිදි කටයුතු කර තිබීම පිළිබඳ සුදුසු පියවර ගත යුතුවීම (යොමුව :3.1.9)

6.10 අන්තර්ජාලය මගින් විද්‍යුත් ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම වැනි නව ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් කළයුතු වීම. (යොමුව : 3.7)

6.11 සංස්කෘතික හා ආගමික ස්ථාන වලින් ආදායම් ඉපයීමේ දී අරමුදල යටතේ පවතින සියලු ස්ථාන ආවරණය වන සේ විද්‍යුත් ප්‍රවේශපත් පද්ධතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම සහ ඒ සඳහා සුදුසුකම්ලත් කාර්ය මණ්ඩලයක් යෙදවීම. (යොමුව : 3.7 )

6.12 කාලීන සහ සත්‍ය අවශ්‍යතාවයන්ද සලකා නිසි ඇගයීමකින් යුතුව දිවයිනේ සියලු දිස්ත්‍රික්ක සහ ආගම් නියෝජනය වන පරිදි විනිවිදභාවයකින් ද යුතුව මූල්‍ය පරිත්‍යාග ප්‍රතිපාදන ලබා දිය යුතු වීම හා එහි මූල්‍ය වටිනාකම තීරණය කිරීම විධිමත් අධිකාර බලයක් සහිත පාර්ශවයන් විසින් සිදු කළ යුතු වීම, (යොමුව :3.2.1.4,3.2.1.6,3.2.1.14)

6.13 අදාල ඉදිකිරීම් ව්‍යාපෘතිවල ප්‍රගතිය පිළිබඳ පසුවිපරම් කල යුතු වීමත්, අදාල ප්‍රතිලාභී ආයතනද සමීප අධීක්ෂණයක් සමග මෙහෙය වියයුතු වීම (යොමුව:3.2.1.7,3.2.1.8,3.2.1.18,3.2.2.14 )

6.14 සියලු ප්‍රසම්පාදන කටයුතු එම මාර්ගෝපදේශයන්ට අනුකූලව කළ යුතු වීමත්, පුරාවිද්‍යා කොමසාරිස්ගේ අනුමැතිය සහ වෙනත් යෝග්‍යතා සහතික ඇතිව පමණක් සංරක්ෂණ ඉදි කිරීම් කටයුතු කළ යුතු වීම (යොමුව:3.2.1.5, 3.2.2.2, 3.2.2.4, 3.3, 5.1.9, 5.2.3.5, 5.2.4.3)

6.15 අනුමත අයවැය ලේඛණය අනුව වියදම් දැරීම සහ සංශෝධිත අයවැය ලේඛනය ඉදිරිපත් කර අනුමත කරගැනීමට කටයුතු කිරීම (යොමුව : 3.2.1.13)

6.16 අදාල චෙක්පත් භාරදීමේ දී මුදල් රෙගුලාසි ප්‍රකාරව නියමිත පරිදි අදායකයා වෙත චෙක්පත් භාරදීමත්, ආයතන වෙත ලබා දුන් අත්තිකාරම් පියවා ගැනීමට කඩිනම් පියවර ගැනීම (යොමුව : 3.2.1.18,3.2.2.5)

6.17 ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය ශක්තිමත් කිරීමේ අරමුණින් අමාත්‍ය මණ්ඩලය විසින් [illegible] යටතේ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත කොන්ත්‍රාත්තු පැවරීමට අනුමැතිය ලබාදී තිබුණද, නැවත රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත මෙම කොන්ත්‍රාත් මෙලෙස පැවරීම තුලින් අමාත්‍ය මණ්ඩලයේ අරමුණු ඉටු නොවීම් පිළිබඳ අවධානය යොමු කළ යුතුය.

(යොමුව : 5.2.3.4, 5.2.3.5)

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

2022 මාර්තු 10 දින

## කමිටුවට ඉදිරිපත් වී ඇති ප්‍රකාශ සහ ලේඛන අනුව අනාවරණය වන කරුණු හා නිරීක්ෂණ

පරීක්ෂණයේ සියලූ ප්‍රකාශ ලබා ගැනීමෙන් පසුව එමෙන්ම අදාළ ලේඛන [illegible] පරීක්ෂණය කරන අතර මධ්‍යම සංස්කෘතික අරමුදලේ කාර්යයීය විමර්ශනය සඳහා මීට කලකට පෙර විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු ගාමිණී සරත් එදිරිසිංහ මහතාගේ සභාපතිත්වයෙන් පරිපාලන සේවයෙන් විශ්‍රාමලත් අමාත්‍යාංශ ලේකම් ගෝධාභය ජයරත්න මහතා සහ ජ්‍යෙෂ්ඨ නීතිඥ හරිගුප්ත රෝහණධීර යන නිළධාරීන්ගෙන් සමන්විත පත් කරන ලද විශේෂ විමර්ශන වාර්තාවද පරිශීලනය කරන ලදී. එම වාර්තාව බොහෝදුරට විශේෂ විගණන පරීක්ෂාවෙන් පෙන්වා දී ඇති කරුණු පිළිබඳව අවධානය යොමු කොට සිදුකර තිබුණු අතර අප කමිටුව විශේෂ විගණන වාර්තාව පරිශීලනය කළද අදාළ කාලයට සම්බන්ධ සියලූ පාර්ශ්වයන් කමිටුව හමුවට ඔවුන්ගේ කැමැත්ත මත පැමිණ පසු ප්‍රකාශ ලබා ගැනීමට කටයුතු කරන ලදී. ඒ අනුව වැඩි අවධානයක් යොමු කරන ලද්දේ පරීක්ෂණ භාරයේ සඳහන් සිද්ධිමය කරුණු වලට පදනම් වූ හේතු පුද්ගල ප්‍රකාශ මගින් සහ ඔවුන් විසින් තම ප්‍රකාශයන් සනාථ කිරීමට ඉදිරිපත් කරන ලද ලේඛන මගින් හෙළිදරව්කර ගැනීමටත් එවැනි සිද්ධිමය කරුණු වලට හේතු පාදක වූ තත්වයන් අරමුදලේ ක්‍රියාමාර්ගවල දුර්වලතා, පරිපාලන සහ මූල්‍ය කළමනාකරණයේ දුර්වලතා සහ ඒ හා සම්බන්ධ සුවිශේෂී කරුණු පවතින්නේද යන්නත් සොයා බැලීමයි.

01. ඉදිරියේ "අරමුදල" නමින් මෙම වාර්තාවේ යම් තැනක ඇතැම්විට හඳුන්වනු ලබන මධ්‍යම සංස්කෘතික අරමුදලේ කළමනාකරණය සමස්තයක් ලෙස අදාළ කාලපරිච්ඡේදයේ ප්‍රශස්ත අයුරින් ක්‍රියාත්මක නොවීමට බලපෑ හේතු ලෙස පහත සඳහන් කරුණු ප්‍රධාන වශයෙන් නිරීක්ෂණය විය.

### 1.1 අරමුදලේ කටයුතුවලට බලය (Authority) ලබා දෙන පාලක මණ්ඩලය රැස්කිරීමේ අපහසුතාවය:-

අරමුදලේ ක්‍රියාකාරීත්වයට සෘජුවම බලපාන අරමුදලේ සමස්ත ක්‍රියාකාරීත්වයට බලය ලබාදීමට 1980 අංක 57 දරණ මධ්‍යම සංස්කෘතික අරමුදල් පනත ප්‍රකාරව විධිවිධාන සලසා ඇති පාලක මණ්ඩලය එහි සංයුතිය අනුව අරමුදලේ අවශ්‍යතාවයට සරිලන පරිදි රැස්කිරීම ප්‍රායෝගිකව අපහසු බව නිරීක්ෂණය වෙයි.1980 අංක 57 දරණ මධ්‍යම සංස්කෘතික අරමුදල් පනතේ 3(1) අනුව පාලක මණ්ඩලයේ සංයුතිය පහත දැක්වේ.

i. අග්‍රාමාත්‍යවරයා - සභාපති
ii. සංස්කෘතික කටයුතු විෂයභාර අමාත්‍යවරයා
iii. මුදල් විෂයභාර අමාත්‍යවරයා
iv. යුනෙස්කෝ විෂයභාර අමාත්‍යවරයා
v. සංචාරක විෂයභාර අමාත්‍යවරයා
vi. හින්දු කටයුතු විෂයභාර අමාත්‍යවරයා
vii. සංස්කෘතික විෂයභාර නියෝජ්‍ය අමාත්‍යවරයා (සිටී නම්)
viii. අග්‍රාමාත්‍යවරයාගේ ලේකම්
ix. සංස්කෘතික විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්
x. පුරාවිද්‍යා කොමසාරිස්
xi. අග්‍රාමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙක්

ඉහත සංයුතිය ප්‍රකාරව ආණ්ඩුකාරණයේ ඉතා කාර්යබහුල ඉහල පෙළේ දේශපාලඥයින් කිහිප දෙනෙකුගෙන් සමන්විත වීම නිසා පාලක මණ්ඩලය නියමිත කාලරාමුවක් තුල රැස්වී තීන්දු තීරණ ගැනීමට නොහැකිවීමෙන් අවිධිමත් සහ අක්‍රමවත් පරිචයන් අරමුදල තුල කාලයක් තිස්සේ අනුගමනය කරන බව කමිටුව නිරීක්ෂණය කරයි. මෙම කමිටුවට දෙන ලද විෂයගත කාලපරිච්ඡේදය තුල පාලක මණ්ඩල රැස්වීම් පැවැත්වූ ආකාරය පිළිබඳ අදහසක් ලබා ගැනීම සඳහා පහත පරිදි ඉදිරිපත් කරමු.

<u>පාලක මණ්ඩල රැස්වීම්- 2015 වර්ෂය අවස්ථා ගණන- 01</u>

දිනය - 2015.02.02 (196) සණ පූරණය නොමැතිවීම මත නොපැවැත්වී ඇත(කෙසේ වුවද එදින පාලක මණ්ඩල සාමාජිකයින් හතර දෙනෙකු සහභාගී වී ඇත)

දිනය - 2015/10/26- (196)(i) පැවැත්වී ඇත.

සහභාගීවූ සාමාජිකයින් (අරලිය ගහ මන්දිරයේදී පවත්වා ඇත)

1. ගරු අග්‍රාමාත්‍යවරයා : <u>සහභාගී වී නැත</u>
2. සංස්කෘතික කටයුතු භාර ගරු අමාත්‍යවරයා : අකිල විරාජ් කාරියවසම් අමාත්‍යවරයා සහභාගී වී ඇත.
3. එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික,විද්‍යාත්මක, සහ සංස්කෘතික සංවිධාන විෂය භාර අමාත්‍යවරයා .: එස්.බී. නාවින්න අමාත්‍යවරයා සහභාගී වී ඇත.
4. සංචාරක විෂය භාර අමාත්‍යවරයා .: <u>සහභාගී වී නැත.</u>
5. හින්දු කටයුතු භාර අමාත්‍යවරයා .: ඩී.එම්. ස්වාමිනාදන් අමාත්‍යවරයා සහභාගී වී ඇත.
6. සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයෙකු සිටිනම්: <u>සහභාගී වී නැත</u>
7. අග්‍රාමාත්‍ය ලේකම්වරයා .: එස්.ඒකනායක සහභාගී වී ඇත.
8. සංස්කෘතික කටයුතු භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා : ඩබ්ලිව්.එම්.බන්දුසේන සහභාගී වී ඇත.
9. පුරාවිද්‍යා කොමසාරිස්වරයා .: සෙනරත් දිසානායක සහභාගී වී ඇත.
10. අග්‍රාමාත්‍යවරයා විසින් පත්කරන ලද නියෝජිතයින් දෙදෙනා .: බී.ඒ.ටී.රොඩ්‍රිගෝ සහ ආනන්ද සිකුරාජපති සහභාගී වී ඇත.
11. මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජෙනරාල්: මහාචාර්ය ප්‍රිශාන්ත ගුණවර්ධන සහභාගී වී ඇත.

<u>පාලක මණ්ඩල රැස්වීම් -2016 වර්ෂය රැස්වූ වා ර ගණන - 03</u>

පා . ම. රැස්වීම් අංක 197 දිනය 2016/02/01

සහභාගී වූ සාමාජිකයින් (අරලියගහ මන්දිරයේදී පවත්වා ඇත)

1. ගරු අග්‍රාමාත්‍යවරයා : රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යවරයා සහභාගී වී ඇත.
2. සංස්කෘතික කටයුතු භාර ගරු අමාත්‍යවරයා :අකිල විරාජ් කාරියවසම් අමාත්‍යවරයා සහභාගී වී ඇත.
3. එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික,විද්‍යාත්මක, සහ සංස්කෘතික සංවිධාන විෂය භාර අමාත්‍යවරයා .: එස්.බී. නාවින්න අමාත්‍යවරයා සහභාගී වී ඇත.
4. සංචාරක විෂය භාර අමාත්‍යවරයා ; සහභාගී වී නැත
5. හින්දු කටයුතු භාර අමාත්‍යවරයා :සහභාගී වී නැත
6. සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයෙකු සිටිනම් : සහභාගී වී නැත

7. අග්‍රාමාත්‍ය ලේකම්වරයා : එස්.ඒකනායක ලේකම්වරයා සහභාගී වී ඇත
8. සංස්කෘතික කටයුතු භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා : සහභාගී වී නැත
9. පුරාවිද්‍යා කොමසාරිස්වරයා : සෙනරත් දිසානායක සහභාගී වී ඇත
10. අග්‍රාමාත්‍යවරයා විසින් පත්කරන ලද නියෝජිතයින් දෙදෙනා : මාර්ග සංවර්ධන අධිකාරියේ ක්‍රියාකාරී අධ්‍යක්ෂක එච්.එම්.හේරත් සහභාගී වී ඇත
11. මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජෙනරාල්: මහාචාර්ය ප්‍රිශාන්ත ගුණවර්ධන සහභාගී වී ඇත.

පා .ම. රැස්වීම් අංක 198 - දිනය - 2016/08/04

සහභාගී වූ සාමාජිකයින් (අරලියගහ මන්දිරයේදී පවත්වා ඇත)

01. ගරු අග්‍රාමාත්‍යවරයා : **සහභාගී වී නැත**
02. සංස්කෘතික කටයුතු භාර ගරු අමාත්‍යවරයා .: අකිල විරාජ් කාරියවසම් අමාත්‍යවරයා සහභාගී වී ඇත
03. එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක, සහ සංස්කෘතික සංවිධාන විෂය භාර අමාත්‍යවරයා .: එස්.බී. නාවින්න අමාත්‍යවරයා සහභාගී වී ඇත
04. සංචාරක විෂය භාර අමාත්‍යවරයා .: **සහභාගී වී නැත**
05. හින්දු කටයුතු භාර අමාත්‍යවරයා : ඩී.එම්. ස්වාමිනාදන් අමාත්‍යවරයා සහභාගී වී ඇත
06. සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයෙකු සිටීනම් : **සහභාගී වී නැත**
07. අග්‍රාමාත්‍ය ලේකම්වරයා : එස්.ඒකනායක ලේකම්වරයා සහභාගී වී ඇත
08. සංස්කෘතික කටයුතු භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා : ඩබ්ලිව්.එම්.බන්දුසේන ලේකම්වරයා සහභාගී වී ඇත
09. පුරාවිද්‍යා කොමසාරිස්වරයා .: සෙනරත් දිසානායක සහභාගී වී ඇත
10. අග්‍රාමාත්‍යවරයා විසින් පත්කරන ලද නියෝජිතයින් දෙදෙනා.: එච්.එම්.හේරත් ක්‍රියාකාරී අධ්‍යක්ෂක සහභාගී වී ඇත
11. මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂක ජෙනරාල්: මහාචාර්ය ප්‍රිශාන්ත ගුණවර්ධන සහභාගී වී ඇත.

පා . ම. රැස්වීම් අංක 199 - දිනය - 2016/11/25

සහභාගී වූ සාමාජිකයින්( අග්‍රාමාත්‍ය කාර්යාලයේදී පවත්වා ඇත)

01. ගරු අග්‍රාමාත්‍යවරයා : **සහභාගී වී නැත**

---

02 සංස්කෘතික කටයුතු භාර ගරු අමාත්‍යවරයා : අකිල විරාජ් කාරියවසම් අමාත්‍යවරයා සහභාගී වී ඇත
03. එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික,විද්‍යාත්මක, සහ සංස්කෘතික සංවිධාන විෂය භාර අමාත්‍යවරයා : **සහභාගී වී නැත**
04. සංචාරක විෂය භාර අමාත්‍යවරයා : **සහභාගී වී නැත**
05. හින්දු කටයුතු භාර අමාත්‍යවරයා : ඩී.එම්. ස්වාමිනාදන් අමාත්‍යවරයා සහභාගී වී ඇත
06. සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයෙකු සිටීනම් : සහභාගී වී නැත
07. අග්‍රාමාත්‍ය ලේකම්වරයා . : එස්.ඒකනායක ලේකම්වරයා සහභාගී වී ඇත
08. සංස්කෘතික කටයුතු භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා : සහභාගී වී නැත

09. පුරාවිද්‍යා කොමසාරිස්වරයා : සහභාගී වී නැත
10. අග්‍රාමාත්‍යවරයා විසින් පත්කරන ලද නියෝජිතයින් දෙදෙනා : එච්.එම්.හේරත් ක්‍රියාකාරී අධ්‍යක්ෂක සහභාගී වී ඇත.
11. මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජෙනරාල්: මහාචාර්ය ප්‍රිශාන්ත ගුණවර්ධන සහභාගී වී ඇත.

## ලංකා මණ්ඩල රැස්වීම් -2017 වර්ෂය රැස්වූ වාර ගණන - 06

. ම. රැස්වීම් අංක 200 දිනය 2017/02/02

සහභාගී වූ සාමාජිකයින් (අරලියගහ මන්දිරයේ පවත්වා ඇත)

01.ගරු අග්‍රාමාත්‍යවරයා : සහභාගී වී නැත

02.සංස්කෘතික කටයුතු භාර ගරු අමාත්‍යවරයා: අකිල විරාජ් කාරියවසම් අමාත්‍යවරයා සහභාගී වී ඇත.

03.එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික ,විද්‍යාත්මක, සහ සංස්කෘතික සංවිධාන විෂය භාර අමාත්‍යවරයා : සහභාගී වී නැත

04. සංචාරක විෂය භාර අමාත්‍යවරයා : සහභාගී වී නැත
05. හින්දු කටයුතු භාර අමාත්‍යවරයා : ඩී. එම්. ස්වාමිනාදන් අමාත්‍යවරයා සහභාගී වී ඇත.
06. සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයෙකු සිටිනම් : සහභාගී වී නැත
07. අග්‍රාමාත්‍ය ලේකම්වරයා : එස්.ඒකනායක ලේකම්වරයා සහභාගී වී ඇත
08. සංස්කෘතික කටයුතු භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා : සහභාගී වී නැත
09. පුරාවිද්‍යා කොමසාරිස්වරයා : සේනරත් දිසානායක සහභාගී වී ඇත
10. අග්‍රාමාත්‍යවරයා විසින් පත්කරන ලද නියෝජිතයින් දෙදෙනා : එච්.එම්.කේ.හේරත් සහභාගී වී ඇත
11. මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂක ජෙනරාල්: මහාචාර්ය ප්‍රිශාන්ත ගුණවර්ධන සහභාගී වී ඇත.

. ම. රැස්වීම් අංක 201 - දිනය - 2017/03/07

සහභාගී වූ සාමාජිකයින් (අරලියගහ මන්දිරයේදී පවත්වා ඇත)

01. ගරු අග්‍රාමාත්‍යවරයා : සහභාගී වී නැත
02. සංස්කෘතික කටයුතු භාර ගරු අමාත්‍යවරයා : අකිල විරාජ් කාරියවසම් අමාත්‍යවරයා සහභාගී වී ඇත
03. එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික,විද්‍යාත්මක,සහ සංස්කෘතික සංවිධාන විෂය භාර අමාත්‍යවරයා : සහභාගී වී නැත
04. සංචාරක විෂය භාර අමාත්‍යවරයා : සහභාගී වී නැත
05. හින්දු කටයුතු භාර අමාත්‍යවරයා : සහභාගී වී නැත
06. සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයෙකු සිටිනම් : සහභාගී වී නැත
07. අග්‍රාමාත්‍ය ලේකම්වරයා : එස්.ඒකනායක ලේකම්වරයා සහභාගී වී නැත
08. සංස්කෘතික කටයුතු භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා : ඒ.එල්.ඒ.අශෝක සිරිවර්ධන අතිරේක ලේකම්වරයා සහභාගී වී ඇත

09. පුරාවිද්‍යා කොමසාරිස්වරයා : සෙනරත් දිසානායක සහභාගි වී ඇත

10. අග්‍රාමාත්‍යවරයා විසින් පත්කරන ලද නියෝජිතයින් දෙදෙනා : එච්.එම්.සෝ හේරත් සහ බී.ඒ.එම්.රොඩ්‍රිගෝ යන අය සහභාගි වී ඇත.

11. මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජෙනරාල්: මහාචාර්ය ප්‍රිශාන්ත ගුණවර්ධන සහභාගි වී ඇත.

ම. රැස්වීම් අංක 202 - දිනය - 2017/05/30

සහභාගි වූ සාමාජිකයින්(අග්‍රාමාත්‍ය කාර්‍යාලයේදී පවත්වා ඇත)

01. ගරු අග්‍රාමාත්‍යවරයා : **සහභාගි වී නැත**

02. සංස්කෘතික කටයුතු භාර ගරු අමාත්‍යවරයා : අකිල විරාජ් කාරියවසම් අමාත්‍යවරයා සහභාගි වී ඇත

03. එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික,විද්‍යාත්මක, සහ සංස්කෘතික සංවිධාන විෂය භාර අමාත්‍යවරයා : එස්.බී. නාවින්න අමාත්‍යවරයා සහභාගි වී ඇත

- සංචාරක විෂය භාර අමාත්‍යවරයා : ජෝන් අමරතුංග අමාත්‍යවරයා සහභාගි වී ඇත

05. හින්දු කටයුතු භාර අමාත්‍යවරයා : **සහභාගි වී නැත**

06. සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයෙකු සිටීනම් : **සහභාගි වී නැත**

07. අග්‍රාමාත්‍ය ලේකම්වරයා : එස්.ඒකනායක ලේකම්වරයා සහභාගි වී ඇත

08. සංස්කෘතික කටයුතු භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා : **සහභාගි වී නැත**

09. පුරාවිද්‍යා කොමසාරිස්වරයා : **සහභාගි වී නැත**

10. අග්‍රාමාත්‍යවරයා විසින් පත්කරන ලද නියෝජිතයින් දෙදෙනා : කේ. හේරත් සහභාගි වී ඇත

11. මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජෙනරාල්: මහාචාර්ය ප්‍රිශාන්ත ගුණවර්ධන සහභාගි වී ඇත.

ම. රැස්වීම් අංක 203 දිනය 2017/08/09

සහභාගි වූ සාමාජිකයින් (අග්‍රාමාත්‍ය කාර්‍යාලයේදී පවත්වා ඇත)

01. ගරු අග්‍රාමාත්‍යවරයා : **සහභාගි වී නැත**

02. සංස්කෘතික කටයුතු භාර ගරු අමාත්‍යවරයා : අකිල විරාජ් කාරියවසම් අමාත්‍යවරයා සහභාගි වී ඇත

03. එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක, සහ සංස්කෘතික සංවිධාන විෂය භාර අමාත්‍යවරයා : **සහභාගි වී නැත**

04. සංචාරක විෂය භාර අමාත්‍යවරයා : ජෝන් අමරතුංග අමාත්‍යවරයා සහභාගි වී ඇත

05. හින්දු කටයුතු භාර අමාත්‍යවරයා : සහභාගි වී නැත

06. සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයෙකු සිටීනම් : සහභාගි වී නැත

07. අග්‍රාමාත්‍ය ලේකම්වරයා : එස්.ඒකනායක ලේකම්වරයා සහභාගි වී ඇත

08. සංස්කෘතික කටයුතු භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා : සහභාගි වී නැත

09. පුරාවිද්‍යා කොමසාරිස්වරයා : සහභාගි වී නැත

10. අග්‍රාමාත්‍යවරයා විසින් පත්කරන ලද නියෝජිතයින් දෙදෙනා: බී.ඒ.ටී රොඩ්‍රිගෝ සහ එච්.එම්.කේ. හේරත් යන අය සහභාගී වී ඇත
11. මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජෙනරාල් මහාචාර්ය ප්‍රිශාන්ත ගුණවර්ධන සහභාගී වී ඇත.

ම. රැස්වීම් අංක 204 - දිනය - 2017/10/19

සහභාගී වූ සාමාජිකයින් (අග්‍රාමාත්‍ය කාර්යාලයේදී පවත්වා ඇත)

01. ගරු අග්‍රාමාත්‍යවරයා : **සහභාගී වී නැත**
02. සංස්කෘතික කටයුතු භාර ගරු අමාත්‍යවරයා : අකිල විරාජ් කාරියවසම් අමාත්‍යවරයා සහභාගී වී ඇත
03. එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික,විද්‍යාත්මක,සහ සංස්කෘතික සංවිධාන විෂය භාර අමාත්‍යවරයා: **සහභාගී වී නැත**
04. සංචාරක විෂය භාර අමාත්‍යවරයා : ජෝන් අමරතුංග අමාත්‍යවරයා සහභාගී වී ඇත
05. හින්දු කටයුතු භාර අමාත්‍යවරයා : **සහභාගී වී නැත**
06. සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයෙකු සිටීනම් :**සහභාගී වී නැත**
07. අග්‍රාමාත්‍ය ලේකම්වරයා : එස්.ඒකනායක ලේකම්වරයා සහභාගී වී ඇත
08. සංස්කෘතික කටයුතු භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා : **සහභාගී වී නැත**
09. පුරාවිද්‍යා කොමසාරිස්වරයා : පී. බී . මණ්ඩාවල සහභාගී වී ඇත
10. අග්‍රාමාත්‍යවරයා විසින් පත්කරන ලද නියෝජිතයින් දෙදෙනා : එච්.එම්.කේ.කරුණාරත්න සහභාගී වී ඇති අතර, 203 **පාලක මණ්ඩල රැස්වීමේදී පාලක මණ්ඩල සාමාජිකයකු ලෙස සහභාගී වූ බී.ඒ.ටී.රොඩ්‍රිගෝ මෙම රැස්වීමේදී ආරාධිතයකු ලෙස සහභාගී වී ඇත.**
11. මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂක ජෙනරාල් මහාචාර්ය ප්‍රිශාන්ත ගුණවර්ධන සහභාගී වී ඇත.

ම. රැස්වීම් අංක 205 - දිනය - 2017/12/28

සහභාගී වූ සාමාජිකයින්

01.ගරුඅග්‍රාමාත්‍යවරයා -**සහභාගී වී නැත.**

02. සංස්කෘතික කටයුතු භාර ගරු අමාත්‍යවරයා -සහභාගී වී ඇත.
03. එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික,විද්‍යාත්මක, සහ සංස්කෘතික සංවිධාන විෂය භාර අමාත්‍යවරයා **සහභාගී වී නැත.**
04. සංචාරක විෂයභාරඅමාත්‍යවරයා - **සහභාගී වී නැත.**
05. හින්දුකටයුතුභාරඅමාත්‍යවරයා සහභාගී වී ඇත.
06. සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයෙකු සිටීනම් - **සහභාගී වී නැත.**
07. අග්‍රාමාත්‍යලේකම්වරයා - සහභාගී වී ඇත.
08. සංස්කෘතික කටයුතු භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා- සහභාගී වී ඇත.
09. පුරාවිද්‍යාකොමසාරිස්වරයා - සහභාගී වී ඇත.
10. අග්‍රාමාත්‍යවරයා විසින් පත්කරන ලද නියෝජිතයින් දෙදෙනා - එච්.එම්.හේරත් සහභාගී වී ඇත.

11. අධ්‍යක්ෂක ජෙනරාල් - ම.සං.අරමුදල - මහාචාර්ය ප්‍රිශාන්ත ගුණවර්ධන සහභාගී වී ඇත.

පාලක මණ්ඩල රැස්වීම -2018 වර්ෂය රැස්වූ වාර ගණන - 02

පා.ම. රැස්වීම් අංක 206 - දිනය - 2018/03/05

සහභාගී වූ සාමාජිකයින් (අග්‍රාමාත්‍ය කාර්යාලයේදී පවත්වා ඇත)

1. ගරු අග්‍රාමාත්‍යවරයා : සහභාගී වී නැත

2. සංස්කෘතික කටයුතු භාර ගරු අමාත්‍යවරයා : අඛිල විරාජ් කාරියවසම් අමාත්‍යවරයා සහභාගී වී ඇත

3. එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික,විද්‍යාත්මක, සහ සංස්කෘතික සංවිධාන විෂය භාර අමාත්‍යවරයා .: සහභාගී වී නැත

4. සංචාරක විෂය භාර අමාත්‍යවරයා : සහභාගී වී නැත

5. හින්දු කටයුතු භාර අමාත්‍යවරයා : සහභාගී වී නැත

6. සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයෙකු සිටිනම් : සහභාගී වී නැත

7. අග්‍රාමාත්‍ය ලේකම්වරයා .: සහභාගී වී ඇත

8. සංස්කෘතික කටයුතු භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා :සහභාගී වී නැත

9. පුරාවිද්‍යා කොමසාරිස්වරයා .: මහාචාර්ය පී.බී. මණ්ඩාවල සහභාගී වී ඇත

10. අග්‍රාමාත්‍යවරයා විසින් පත්කරන ලද නියෝජිතයින් දෙදෙනා : එච්.එම්.කේ. කරුණාරත්න සහ බී.ඒ.ටී. රොඩ්‍රිගෝ සහභාගී වී ඇත.

11. අධ්‍යක්ෂක ජෙනරාල් - ම.සං.අරමුදල : මහාචාර්ය ප්‍රිශාන්ත ගුණවර්ධන සහභාගී වී ඇත

සටහන :බී.ඒ.ටී. රොඩ්‍රිගෝ පාලක මණ්ඩල සාමාජිකයෙකු වශයෙන්ද ආරාධිතයෙකු වශයෙන් ද අත්සන් තබා ඇත.

පා. ම. රැස්වීම් අංක 206 - දිනය - 2018/03/05

සහභාගී වූ සාමාජිකයින් (අග්‍රාමාත්‍ය කාර්යාලයේදී පවත්වා ඇත)

1. ගරු අග්‍රාමාත්‍යවරයා : ගරු අග්‍රාමාත්‍යතුමා සහභාගී වී ඇත.

2. සංස්කෘතික කටයුතු භාර ගරු අමාත්‍යවරයා .: විජේදාස රාජපක්ෂ අමාත්‍යවරයා සහභාගී වී ඇත

3. එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික,විද්‍යාත්මක, සහ සංස්කෘතික සංවිධාන විෂය භාර අමාත්‍යවරයා .: ආචාර්ය සරත් අමුණුගම අමාත්‍යවරයා සහභාගී වී ඇත

4. සංචාරක විෂය භාර අමාත්‍යවරයා : ජෝන් අමරතුංග අමාත්‍යවරයා සහභාගී වී ඇත

5. හින්දු කටයුතු භාර අමාත්‍යවරයා : සහභාගී වී නැත

6. සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයෙකු සිටිනම් : සහභාගී වී නැත

7. අග්‍රාමාත්‍ය ලේකම්වරයා .: සහභාගී වී ඇත

8. සංස්කෘතික කටයුතු භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා : සහභාගී වී ඇත

9. පුරාවිද්‍යා කොමසාරිස්වරයා .: මහාචාර්ය පී.බී. මණ්ඩාවල සහභාගී වී ඇත

10. අග්‍රාමාත්‍යවරයා විසින් පත්කරන ලද නියෝජිතයින් දෙදෙනා : එච්.එම්.කේ. කරුණාරත්න සහභාගී වී ඇත

1. අධ්‍යක්ෂක ජෙනරාල් - ම.සං.අරමුදල : මහාචාර්ය ප්‍රශාන්ත ගුණවර්ධන සහභාගි වී ඇත

මෙහිදී: අඛිල විරාජ් කාරියවසම් අමාත්‍යවරයා අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් සහභාගි වෙන අවස්ථාවේදී විජේදාස රාජපක්ෂ අමාත්‍යවරයා සංස්කෘතික අමාත්‍යවරයා වශයෙන් සහභාගි වී ඇති අතර පෙර පාලක මණ්ඩලයේ පාලක මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් අත්සන් තැබූ බී.ඒ.ටී. රොඩ්‍රිගෝ මහතා ආරාධිතයෙකු වශයෙන් අත්සන් තබා ඇත.

## පාලක මණ්ඩල රැස්වීම් -2019 වර්ෂය රැස්වූ වාර ගණන - 02 (එක් අවස්ථාවක් ආභිමුඛයෙන් පවත්වා ඇත)

පා. ම. රැස්වීම් අංක 208 - දිනය - 2019/03/15

සහභා ගී වූ සාමාජිකයින් (අරලියගහ මන්දිරයේදී පවත්වා ඇත)

1. ගරු අග්‍රාමාත්‍යවරයා : **සහභාගි වී නැත**
2. සංස්කෘතික කටයුතු භාර ගරු අමාත්‍යවරයා .: සජිත් ප්‍රේමදාස අමාත්‍යවරයා සහභාගි වී ඇත
3. එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික,විද්‍යාත්මක, සහ සංස්කෘතික සංවිධාන විෂය භාර අමාත්‍යවරයා .: **සහභාගි වී නැත**
4. සංචාරක විෂය භාර අමාත්‍යවරයා : ජෝන් අමරතුංග අමාත්‍යවරයා සහභාගි වී ඇත.
5. හින්දු කටයුතු භාර අමාත්‍යවරයා :**සහභාගි වී නැත**
6. සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයෙකු සිටීනම් : **සහභාගි වී නැත**
7. අග්‍රාමාත්‍ය ලේකම්වරයා .: සහභාගි වී ඇත
8. සංස්කෘතික කටයුතු භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා : සහභාගි වී ඇත.
9. පුරාවිද්‍යා කොමසාරිස්වරයා .: මහාචාර්ය පී.බී. මණ්ඩාවල සහභාගි වී ඇත
10. අග්‍රාමාත්‍යවරයා විසින් පත්කරන ලද නියෝජිතයින් දෙදෙනා : පූජ්‍ය දඹර අමිල හිමි සහභාගි වී ඇත.
11. අධ්‍යක්ෂක ජෙනරාල් - ම.සං.අරමුදල : **සහභාගි වී නැත**

## 1 පාලක මණ්ඩල සංයුතියේ ස්වභාවය -

ඉහත සඳහන් පාලක මණ්ඩල රැස්වීම් වලට සහභාගි වීම තහවුරු කරන පැමිණීමේ ලේඛනයේ සටහන් අනුව අදාළ කාල පරිච්ඡේදය තුල පාලක මණ්ඩල රැස්වීම් සියල්ලම ගරු අග්‍රාමාත්‍යතුමාගේ නිල නිවෙස වූ අරලිය ගහ මන්දිරයේ හෝ ගරු අග්‍රාමාත්‍යතුමාගේ නිල කාර්යාලයේ පවත්වා ඇති වුවද එතුමාට රැස්වීමට සහභාගිවීමට අවස්ථාව ලැබී ඇත්තේ අවස්ථා දෙකකදී පමණි. එය එතුමාගේ කාර්යබහුලත්වය මත පිළිගත හැකි තත්වයක් බව කමිටුවේ මතයයි. ඒ අනුව එවැනි කාර්යබහුල තනතුරක් දරන්නෙකුට මෙවැනි එක් ආයතනයක් සම්බන්ධයෙන් විශාල වගකීමක් හෝ වගවීමක් පැවරිය නොහැකි බව සාමාන්‍ය දැනුමක් ඇති පුද්ගලයෙකුට වුවද වැටහෙනු ඇත. එසේම දේශපාලනික විධායකය නියෝජනය කරන ගරු අගමැතිවරයා හැර තවත් කැබිනට් ඇමතිවරුන් පස් දෙනෙකු පාලක මණ්ඩලය නියෝජනය කරනු ලබයි. තවද ස්ථිර විධායකය නියෝජනය කරන ඉහල පෙළේ

පරිපාලන සහ මූල්‍ය නිළධාරීන්ද ක්‍රියාපදගනකුගේ සහභාගීත්වයද පාලක මණ්ඩලය රැස්කිරීම සඳහා අවශ්‍ය නොකරේ. පාලක මණ්ඩලය රැස්කිරීම සඳහා එහි සභාපතිවරයාගෙන් සුදුසු දිනයක් චෙන්කරවා ගැනීමේ පරිචයක් තිබෙන බවද ප්‍රකාශ මගින් අනාවරණය වේ. පාලක මණ්ඩලයේ සභාපතිවරයා වන ගරු අග්‍රාමාත්‍යතුමා ඇතුළු ගරු ඇමතිවරුන්ගේ කාර්යය බහුලත්වය සහ එතුමන්ලා වෙත පැවරී ඇති විශාල විෂය පථය අනුව අරමුදලේ කළමනාකාරිත්වයට අවශ්‍ය පරිදි පාලක මණ්ඩලය ප්‍රායෝගිකව රැස්කිරීමේ අපහසුතාවයක් තිබෙන බව මෙම කමිටුව පිළිගනී.

1.1 පාලක මණ්ඩල රැස්වීම් සහ සත පූරණය-

මෙම තත්වය මත නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යංශයේ 2019 කාල පරිච්ඡේදයේ සිටි ලේකම් විසින් අග්‍රාමාත්‍ය ලේකම් ඇමතූ ලිපියක් මගින් (ප්‍ර.ඇ.18)මෙම පාලක මණ්ඩලය රැස්කිරීමට ඇති අවශ්‍යතාවය පෙන්වා දී එය නොපමාව රැස්කිරීමට පාලක මණ්ඩලයේ සභාපතිවන අග්‍රාමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගෙන කටයුතු කරන ලෙස ඉල්ලීමක්ද කර ඇති බව නිරීක්ෂණය වේ. කෙසේ වුවද මෙම තත්වය යටතේ ගණපූරණය සඳහා සාමාජිකයින් හතර දෙනෙකුගේ සහභාගීත්වය තිබීම යහපත් ලක්ෂණයක් බවද කමිටුව නිරීක්ෂණය කරයි.

ර්තමානයට ප්‍රායෝගික නොවන පාලක මණ්ඩලයේ මෙම සංයුතිය හේතු කොට ගෙන ාලක මණ්ඩලය නිශ්චිත කාලරාමුවක් තුල රැස්කර ගැනීමට අපහසු වීම නිසා අක්‍රමවත් හා අවිධිමත් මූල්‍ය කළමනාකරණ පරිචයන් ඇති කර ගෙන දීර්ඝ කාලයක් තිස්සේ අරමුදල නුගමනය කරගෙන යන බව කමිටුව නිරීක්ෂණය කරයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මූල්‍ය හා පිරිස් කළමනාකරණය, බඳවා ගැනීමේ කාර්යපටිපාටිය, නිශ්චිත ඉලක්ක ඔස්සේ රමුදල මෙහෙයවීම අඩපණ වී ඇති බව කමිටුව තවදුරටත් නිරීක්ෂණය කරයි.

.2 පාලක මණ්ඩල ආවරණ අනුමැතියට යටත්ව පත්‍රිකා ඉදිරිපත් කිරීම

මෙහි තත්වය මත ආයතනය පවත්වා ගැනීමේ කටයුතු සඳහා අවශ්‍ය පියවර තිසි කලට ාවට ගෙන පාලක මණ්ඩලයේ ආවරණ අනුමැතියට යටත්ව පාලක මණ්ඩල පත්‍රිකා ඉදි ත් කිරීමට සිදුවීම වැලැක්විය නොහැකි කරුණක් වූ බවට කළමනාකරණය ඉදිරිපත් රන තර්කය සමග කමිටුවට එකඟ වීමට සිදුවේ.

.3 පාලක මණ්ඩලයේ සංයුතිය වෙනස් විය යුතු බව

රමුදලේ ක්‍රියාකාරිත්වය මනාව පවත්වා ගෙන යෑමට හැකි වන පරිදි හා පාලක මණ්ඩලය ක්ෂණික කාල සටහනකට රැස්කරගත හැකිවන පරිදි පාලක මණ්ඩල සංයුතිය වෙනස් විය යුතු බව සහ/හෝ නව පාලන ව්‍යුහයක් හඳුන්වා දිය යුතු බව මෙම කමිටුව අදහස් කරයි.

.4 209 වන පාලක මණ්ඩලය රැස්වීම භෞතිකව රැස්වී නොමැති බව

09 වන පාලක මණ්ඩල රැස්වීම භෞතිකව සිදුවී නොමැතිබව මෙම කමිටුව පිළිගනී. නමුත් අරමුදලේ ප්‍රධාන පරිපාලන නිළධාරියා වන බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යංශයේ ලේකම් විසින් පාලක මණ්ඩලය රැස්කිරීම පිළිබඳව ගරු අග්‍රාමාත්‍යතුමාගේ ලේකම් වෙත දිනයක් ඉල්ලා ලිපි ලිවීමෙන් එය භෞතිකව පැවැත්වීමට

ත්සහ දරා ඇති බවටද කරුණු ඉදිරිපත් වේ.අරමුදලේ ප්‍රධාන පරිපාලන නිලධාරියා මෙම මිටුව වෙත කළ ප්‍රකාශයේ සඳහන් වන්නේ තමා අග්‍රාමාත්‍ය ලේකම් වෙත ලිපි ලිවීමෙන් ගැනෑවයි විශාල ප්‍රමාණයක් දුරකතන ඇමතුම් මේ පිළිබඳව ලබා දුන් බවත්, මේ පිළිබඳව ස්කෘතික කටයුතු අමාත්‍යවරයා දැනුවත් කර පාලක මණ්ඩලය රැස්කර ගැනීමට ත්සහ කළ බවත් ය.

එන පාලක මණ්ඩලය භෞතිකව රැස්වී නොමැති වුවද එහි සාමාජිකයින් වෙත එකී ලක මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබූ පත්‍රිකා සියල්ල පූර්වයෙන් ලබා දී එකී ත්‍රිකා සියල්ල සාමාජිකයින් අධ්‍යයනය කිරීමෙන් පසුව ඒ බවට පිළිගෙන අත්සන් තබා යි බවට සැක කටයුතු ලේඛන පිළිබඳ රජයේ රස පරීක්ෂකවරයා විසින් කමිටුවට ලබා න ලද විශේෂඥ මතය අනුව ඔවුන්ගේ අත්සන් වල නිර්ව්‍යාජභාවය තහවුරු කරමින් ර්තා ලබා දී ඇති නිසාය.

## නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික අමාත්‍යංශයේ ලේකම් අරමුදලේ ප්‍රධාන ිපාලන නිලධාරියා වීම හා ඉන් පැනනගින කළමනාකරණ ගැටළු.

කට, නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යංශයේ ලේකම් තමා යටතේ පැවති ස්ථාවක් වන මධ්‍යම සංස්කෘතික අරමුදලේ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තුවට ගකිවයුතු ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වන අතර ඔහු මධ්‍යම සංස්කෘතික අරමුදලේ යුතු පිළිබඳ බලයලත්, ඉහළම ප්‍රධාන පරිපාලන නිලධාරියාද වේ.අමාත්‍යංශ ලේකම් ටමින් පාර්ලිමේන්තුවට වගකිවයුතු ප්‍රධාන ගණන්දීමේ නිලධාරියෙක් සිටින්නේ මාගේ අමාත්‍යංශය යටතේ ඇති ආයතන කටයුතු වල අධීක්ෂණ මට්ටමේ වුවත්,එහිදී ාත්‍යංශ ලේකම් විසින්ම තමා යටතේ තම අධීක්ෂණයට ලක්වන අරමුදලේ ප්‍රධාන පාලන නිලධාරියා ලෙස කටයුතු කිරීම නිසා එහි පරමාර්ථය මෙහිදී ඉටු නොවන ත්වයක් නිරීක්ෂණය වේ. එසේම අරමුදල සම්බන්ධයෙන් අමාත්‍යංශ ලේකම් විසින් යෝග දීමේදී, නියෝග දීම හා ඒවා ක්‍රියාත්මක කිරීම එකම පුද්ගලයෙකු විසින් කිරීමට ස්ථාව සැලසීම මගින් වගකීම් සහ වගවීම් සම්බන්ධයෙන් එකිනෙක ගැටුමක් ර්මාණය වීමට ඉඩ ඇති බව කමිටුව නිරීක්ෂණය කරයි.

යතන කළමනාකරණ අභ්‍යන්තර පාලනයේ වැදගත් අවස්ථාවන් කීපදෙනෙක් අතරේ කීම් බෙදීයන ආකාරයේ වැඩ බෙදාදීමේ සංකල්පයට හා වැඩ අධීක්ෂණය කිරීමේ ශ්‍යතාවය, පසුවිපරම් කාර්යයන් පිළිබඳව සලකා බැලීමේදී මෙම තත්වය ළමනාකරණ ගැටළු මතු කරන්නක් බව නිරීක්ෂණය වෙයි.

### ැඩ බෙදාදීමේ සංකල්පය (segregation of duties)

ා කළමනාකරණයක් සඳහා ප්‍රධාන පද්ධතිවල තීරණාත්මක කාර්යයන් නිලධාරීන් දෙනෙක් අතරේ බෙදා දීම මින් අදහස් කෙරේ.ඉන් එක් අයෙකුට බලතල හා කාර්යයන් ් රැස්වීමෙන් සිදුවන අක්‍රමිකතා, නොසැලකිල්ල, මගහැරීම්, වංචා ආදිය අවම ර්මත්,ඵලදායීතාවය හා කාර්යක්ෂමතාවය වැඩිකිරීමක් මින් අදහස් වේ.මෙය අභ්‍යන්තර ධන ක්‍රමවේදයක් ලෙසද සැලකේ.

හත් අරමුදලේ ක්‍රියාකාරීත්වයේදී මෙම සංකල්පය ක්‍රියාවට නංවා නැති බව නිරීක්ෂණය

1. නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යංශයේ ලේකම්ගේ පාලන අවකාශය (span of control)

ළමනාකරුවෙකුට හෝ පරිපාලකයෙකුට තමා යටතේ පාලනය කිරීමට ඇති අවකාශයේ ප්‍රමාණය මින් අදහස් වේ. එම අවකාශය කාර්යක්ෂමව හා ඵලදායී ලෙස පාලනය කිරීමට තරම් හැකියාවක් කළමනාකරුවෙකුට තිබිය යුතුය. යොමුගත අමාත්‍යංශයේ ලේකම්ගේ පාලන අවකාශය අනුව නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යංශය යටතේ ඇති පහත දැක්වෙන සියලු ආයතනවල මූල්‍ය හා පරිපාලන කටයුතු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වගකිව යුතු ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වේ.

1. බුද්ධශාසන, ආගමික, හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
2. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
3. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
4. ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
5. ජාතික ලේඛණාරක්ෂක දෙපාර්තමේන්තුව
6. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
7. රජයේ කර්මාන්ත ශාලාව
8. මධ්‍යම සංස්කෘතික අරමුදල
9. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
10. රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව
11. අපේ ගම ව්‍යාපෘතිය
12. ජාතික චිත්‍රපටි සංස්ථාව
13. ශ්‍රී ලංකා කලා මණ්ඩලය
14. ජනකලා කේන්ද්‍රය
15. ටවර් හෝල් පදනම
16. ගාලු උරුමය පදනම
17. ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය
18. රත්මිණි තැන්න ජාතික ටෙලි සිනමා උද්‍යානය

සේම යොමුගත අමාත්‍යංශයේ ගණන්දීමේ නිලධාරියා මෙන්ම මධ්‍යම සංස්කෘතික දල් පනතින් බලයලත් අරමුදලේ ප්‍රධාන පරිපාලන නිලධාරියාගේ රාජකාරීද මෙම නිලධාරියාගේ පාලන අවකාශයට යටත් වන අතර ඊට අමතරව අරමුදල මගින් ක්‍රියාත්මක කරන ලද සසුනෝදය හා සිසුදහම් සෙවණ දීපව්‍යාප්ත කඩිනම් වැඩසටහන්වල කටයුතුද මාහුගේ පාලන අවකාශයට ඇතුල්වීම නිසා එක් අමාත්‍යංශ ලේකම් කෙනෙකුට මෙවැනි පාලන ඵලදායී ලෙස හා කාර්යක්ෂම ලෙස පාලනය කිරීමට හැකියාවක් තිබේදැයි සැලකිල්ලට භාජනය කළ යුතුව තිබුණි.

අරමුදලේ මූල්‍ය හා පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තුවට වගකිවයුතු ගණන්දීමේ නිලධාරියා ප්‍රධාන පරිපාලන නිලධාරියාද නොමැති නම් අධ්‍යක්ෂ ජනරාල් ද යන්න පැහැදිලි නොවීම.

අරමුදල් පනත අනුව සංස්ථාවක් වුවත් සංස්ථාවක සංයුතිය පරිදි සභාපතිවරයෙකු නොමැති බැවින් පරිපාලනයේ ගැටළු සහගත තත්වයක් කමිටුව නිරීක්ෂණය කරයි.

ණ්ඩලීකරණයේ(staffing) විචලතා :

ාතනයන පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා සුදුසු කාර්යය මණ්ඩලයක් බඳවා ගැනීම ණ්ඩලීකරණයෙන් අදහස් කෙරේ. අරමුදලේ ඉහළ කළමනාකරණයේ ප්‍රධාන තනතුරු අධ්‍යක්ෂ (සැලසුම්), අධ්‍යක්ෂ (පාලන) අධ්‍යක්ෂ (මුදල්), හා අභ්‍යන්තර විගණක වැනි තුරු වලට ඒ ඒ තනතුරු ප්‍රතිඵලදායී ලෙස හා කාර්යක්ෂමව පවත්වා ගැනීමට අවශ්‍ය ්‍යකම් දැක්වෙන බඳවා ගැනීම් පටිපාටි තිබුණත් එකී බඳවා ගැනීම් පටිපාටි අනුව සින් බඳවා නොගෙන දිගින් දිගටම පුද්ගලයින් වැඩබලන,වැඩ ආවරණ රාජකාරි රන පදනම මත බඳවාගෙන අරමුදලේ කටයුතු අඛණ්ඩව කරගෙන යාම සිදුකර අධ්‍යක්ෂ ජනරාල් තනතුරට විටින් විට කෙටිකාලයකට පුද්ගලයින් බඳවා ගැනීමත් ර කාලවල අධ්‍යක්ෂ ජනරාල් තනතුර හිස්ව තිබීමත් යන කරුණු මත අරමුදලේ නාකරණය ප්‍රශස්ත අයුරින් සිදුවීමට බාධා ඇති වී ඇති බව නිරීක්ෂණය කරමු.

2019 කාලසීමාවේදී අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ සේවයේ නියුතුවීම් පහත දැක්වේ.

| වයේ යෙදුණු කාලසීමාව | අධ්‍යක්ෂ ජනරාල්ගේ නම |
|---|---|
| 2.05.03-2015.03.18 | මහාචාර්ය ගාමිණී අධිකාරි |
| 5.03.19-2018.11.08 | මහාචාර්ය එම්.ඩී.ප්‍රිශාන්ත ගුණවර්ධන |
| 3.11.09-2020.01.01 | පුරප්පාඩු |
| 0.01.02-2021.03.09 | මහාචාර්ය ගාමිණී අධිකාරි |

**දාළ කාලපරිච්ඡේදයේ අරමුදල දේශපාලන අධිකාරියේ පාලනය විටින්විට සිවීම හා ඊට අනුරූපව සංස්කෘතික අමාත්‍යංශයේ ලේකම් තනතුර මෙන්ම ුදලේ ප්‍රධාන පරිපාලන නිලධාරීන්ද වෙනස්වීම.**

2019 අතර කාලයේ මධ්‍යම සංස්කෘතික අරමුදල ඇතුළත් වූ අමාත්‍යංශ පාලනය කළ ත්‍යවරුන් පහත දැක්වේ.

- අකිල විරාජ් කාරියවසම් මහතා
- විජේදාස රාජපක්ෂ මහතා
- සජිත් ප්‍රේමදාස මහතා
- මහින්ද රාජපක්ෂ මහතා

හෝ දේශපාලන අධිකාරීන් තමාගේ පාලන කාලය තුළ සංස්කෘතික අරමුදල මගින් ගේ පුද්ගලික සංකල්ප මත විශාල මූල්‍ය දායකත්වයක් අරමුදල විසින් දැරිය යුතු ටහන් ආරම්භකර පවත්වාගෙන යාමට උත්සහ කළත් එතෙක් පැවති වැඩසටහන් ට ගෙන යාමට උනන්දුවක් දක්වා නැති බව පෙනේ. එවැනි යම් වැඩසටහනක් එම ාවේ පැවති ජාතික අවශ්‍යතාවයක් මත සහ/හෝ මහජන යහපත මත ආරම්භ කර වා ගෙන යෑමේදී යම් අඩුපාඩුකම්, අවිධිමත්භාවයන්, අක්‍රමිකතාවයන් නිරීක්ෂණය ලද්දේ නම් ඒවා නිවැරදි කරගනිමින් එකී ජාතික අවශ්‍යතාවය,මහජන යහපත ශාත් කරගැනීමේ ක්‍රියාමාර්ග ගතයුතුව තිබූ බව කමිටුව නිරීක්ෂණය කරයි. පහත වන පරිදි ඉහත නම් සඳහන් අමාත්‍යවරුන්ගේ ධූරකාලය තුළ මධ්‍යම සංස්කෘතික දල විසින් ආරම්භ කළ වැඩසටහන් මෙසේය.

| අමාත්‍යතුමා | වැඩසටහන |
|---|---|
| ...කිල විරාජ් කාරියවසම් මහතා | සසුනෝදය |
| ...විජේදාස රාජපක්ෂ මහතා | අතීත ශ්‍රී ලාංකික රාජ රාජ මහාමාත්‍යාදීන් ආගමික වශයෙන් දේශය උදෙසා සිදුකළ මෙහෙවර වෙනුවෙන් පුන්‍යානුමෝදනා වැඩසටහන-2018 |
| ...සජිත් ප්‍රේමදාස මහතා | සිසුදහම් සෙවණ |

**. අරමුදලේ ක්‍රියාත්මක වූ විශේෂ වැඩසටහන් ජාතික සැලැස්මකට අනුව ...ඛණ්ඩව ක්‍රියාත්මක නොවීම හා ඒවා දේශපාලන අධිකාරිය වෙනස්වීමත් සමග ...තරමග නතර වීම.**

...කිල විරාජ් කාරියවසම් මහතා යටතේ සසුනෝදය වැඩසටහන 2017 දී ආරම්භ වී අදියර i, ... iii, වශයෙන් ක්‍රියාත්මක වී ආගමික ස්ථාන 13000ක් සංවර්ධනය සඳහා සැලසුම් කළත් ... අදියරේදී ආගමික ස්ථාන 150ක් ද, දෙවන අදියරේදී ආගමික ස්ථාන 815ක්ද, තුන්වන ...යරේදී ආගමික ස්ථාන 80ක් ලෙස ප්‍රතිසංස්කරණය හා සංවර්ධන සඳහා ආධාර ලබා දී ...ති නමුත් 2018 මා ර්තු මස සංස්කෘතික අරමුදල අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නැවත ...ංස්කෘතික අමාත්‍යාංශයට මාරුවීමත් සමග එකී සසුනෝ දය වැඩසටහන් ඉන් ඉදිරියට ...ියාත්මක නොවී මුළුමනින්ම නතර කිරීමට නව දේශපාලන සහ පරිපාලන අධිකාරිය ...රණය කර ඇත.එයට හේතු වශයෙන් කමිටුවට අනාවරණය වූයේ අනුප්‍රාප්තික ...මාත්‍යවරයා සහ ලේකම්වරයා එම වැඩසටහන අසාර්ථක සහ ඵලදායී නොවන ...ැඩසටහනක් ලෙස තීරණය කිරීම නිසාය.

...න් අනතුරුව මධ්‍යම සංස්කෘතික අරමුදල අයත් සංස්කෘතික අමාත්‍යධූරය දැරූ විජේදාස ...ාජපක්ෂ මහතා යටතේ සසුනෝදය ක්‍රියාත්මක නොවූ අතර එතුමා විසින් අතීත ශ්‍රී ...ාංකික රාජ රාජ මහාමාත්‍යාදීන් ආගමික වශයෙන් දේශය උදෙසා සිදුකළ මෙහෙවර ...වෙනුවෙන් පුන්‍යානුමෝදනා වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇති බවත් ඒ සඳහා කිසිදු ...පූර්ව/ආවරණ අනුමැතියක් ලබා ගෙන නොමැති බවත් අභ්‍යන්තර විගණකගේ ...ප්‍රකාශයෙන් අනාවරණය වේ.(ප්‍ර.ඇ.25)

...අනතුරුව මධ්‍යම සංස්කෘතික අරමුදල අයත් සංස්කෘතික අමාත්‍යධූරය දැරූ සජිත් ...ප්‍රේමදාස මහතා විසින් 2019 වසරේ සිසුදහම් සෙවණ ජාතික වැඩසටහන මගින් ...රු.300,0000/- ක් බැගින් වැය වන දහම් පාසල් ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩසටහන ...ප්‍රවයාප්තව ආරම්භ කර ඇති අතර ඉන් ව්‍යාපෘති 370ක් නිම කිරීමට සැලසුම් කළ බවට ...ාර්තා වුවත් ව්‍යාපෘති 368ක් පමණක් ක්‍රියාත්මක කිරීම සිදුකළ බවට අනාවරණය වේ.මින් ...ව්‍යාපෘති 222ක වැඩ 100%ක් නිමවූ නමුත් 2019 වසර තුළ ඉතිරි ව්‍යාපෘති 166 නිම කිරීමේ ...කටයුතු නතර කර ඒ පිළිබඳ අක්‍රමිකතා පරීක්ෂණ පමණක් ආරම්භ කර ඇත. 2019 ...වර්ෂයේදී "සිසු දහම් සෙවණ" ව්‍යාපෘතිය නවතා දැමීමට සිදුවී ඇත්තේ මුදල් අමාත්‍යාංශය ...විසින් කරන ලද නියෝගයක් මත බව එවකට සංස්කෘතික අමාත්‍යාශයේ ප්‍රධාන මූල්‍ය ...ගණකාධිකාරීගේ ප්‍රකාශයෙන් නිරීක්ෂණය වේ. (ප්‍ර.ඇ.12)

ාපා ව්‍යාපෘතීන් සැලසුම් කිරමේදී එවා කඩිනම් ව්‍යාපෘති ලෙස ක්‍රියාත්මක
ඇති නමුත් එවැනි කඩිනම් ව්‍යාපෘතියකට අවශ්‍ය සම්පත් වන අමාත්‍ය
ා මණ්ඩලය, ක්ෂේත්‍ර නිළධාරීන්, ඉදිකිරීම් කාලය, ගැන නොසලකා
දලේ පැවතුණු සුලභ මූල්‍ය සම්පත් මත පමණක් පදනම්ව වැඩසටහන්
ත්මක කිරීම:-

ෝදය වැඩසටහන යටතේ එකක් රු. 500,000 බාහිර ආගමික ස්ථාන 13,000 ක්
ධනය සඳහා සැලසුම් කර ඇති අතර සිසුදහම් සෙවණ වැඩසටහන යටතේ එකක්
00,000 ක ඇස්තමේන්තුවක් මත ව්‍යාපෘති 370ක් සඳහා සැලසුම් කර ක්‍රියාත්මක කර
මෙම සැලසුම්වල දුර්වලතාවය නිසා සසුනෝදය සැලසුම් කළ ව්‍යාපෘති 13000ක් අදියර
ටතේ ව්‍යාපෘති 370 න් ව්‍යාපෘති 222ක්, නිමකර ඇති අතර ව්‍යාපෘති 166ක් ක්‍රියාත්මක
අතරමග නැවතී ඇත.

දීපව්‍යාප්ත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසුකම් සහිත මානව සම්පත්
යුතු අතර එමගින් සැලසුම් කිරීම ශක්‍යතා අධ්‍යයනය, තෝරා ගැනීම, මෙහෙයවීම,
පරම් කාර්යය සිදුකිරීම කළ යුතුවේ.සිසු දහම් සෙවණ ව්‍යාපෘති තෝරා ගැනීම සඳහා
හෝවිට එක් එක් දිස්ත්‍රික්කයට කළමනාකාර සහකරුවකු බැගින් යෙදවූ අවස්ථා
ට ඇත. (ඇමුණුම 41)

නෝදය වැඩසටහනට ව්‍යාපෘති තෝරා ගැනීමේදී ඉතාමත් අවිධිමත් අක්‍රමවත් සහ
ල දේශපාලන අවශ්‍යතාවයක් මත සිදු කරන ලද අසාර්ථක ව්‍යාපෘතියක් බවට එවකට
ාපන අමාත්‍යාංශයේ සිටි ලේකම් සුනිල් හෙට්ටිආරච්චි මහතා මෙන්ම ඉන්පසුව උසස්
ාපන සහ සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම්ව සිටි ජේ.ජේ. රත්නසිරි මහතාගේ
ශය මගින් මනාව තහවුරු වී ඇත. එම හේතුව මතම සසුනෝදය ව්‍යාපෘතිය ආරම්භ
දේශපාලන අධිකාරිය වෙනස් වූ වහාම සංස්කෘතික අමාත්‍යාංශයභාර නව
ශපාලන අධිකාරිය මගින් එකී අසාර්ථක සසුනෝදය ව්‍යාපෘතිය නවතා දැමීමට කටයුතු
ඇති බව එවකට සිටි ලේකම්වරයාගේ ප්‍රකාශය මගින් හෙළිවිය. කෙසේ වුවද
නෝදය ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අවධියේදීද එකී ව්‍යාපෘතියේ පසු විපරම් නිසි පරිදි
වී නොමැති බව එවකට අධ්‍යක්ෂ ජනරාල්ව සිටි මහාචාර්ය ප්‍රශාන්ත ගුණවර්ධනගේ
ශය මගින් නිරීක්ෂණය වේ. ඔහු සඳහන් කරන්නේ පසුවිපරම් වාර්තා සම්බන්ධයෙන්
ට අවබෝධයක් නොමැති බවයි. ව්‍යාපෘති කළමනාකරුවන් පවසන්නේ අදාල වැඩබිම්
ව්‍යාපෘති කාර්යාලවල සිට ඈත ප්‍රදේශවල පැවති බැවින් පසුවිපරම් කිරීම අපහසු වූ බවයි.
සේම තවත් ව්‍යාපෘති කළමනාකරුවෙකු පැවසුවේ නිසි පසු විපරම් නොතිබූ නිසා ඔවුන්
ථාන පරීක්ෂාවේදී නිරීක්ෂණය කරන ලද ඉදිකිරීම් සැබවින්ම සසුනෝදය ආධාර මගින්
කරන ලද්දේ ද යන්න නිශ්චිතවම කිවනොහැකි බවයි.

සේම සිසුදහම් සෙවණේ ඉදිකිරීම් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව හා රාජ්‍ය සංවර්ධන හා
ර්මාණ නීතිගත සංස්ථාව මගින් කඩිනම් කර ගැනීමට පෙර සැරි ක්‍රමවේදය හා design and
ild ක්‍රමවේදය යොදා ගැනීමේ තාක්ෂණය අනුගමනය කළත් නිම කිරීමට දී ඇති කාල සීමා
දවීම නිසාත්, පසුවිපරම් කාර්යයන් දුර්වල වීම නිසාත් ඉලක්ක වලට ළඟාවීමට නොහැකි
ඇති බව නිරීක්ෂණය වේ.

08. අරමුදලේ අභ්‍යන්තර විගණක තනතුර කෙලින්ම ප්‍රධාන පරිපාලන නිලධාරියා යටතේ පැවතිය යුතු මුවත් අරමුදලේ සංවිධාන සටහන අනුව අභ්‍යන්තර විගණක තනතුර අධ්‍යක්ෂ(සංවර්ධන) යටතේ පැවතීම:-

රාජ්‍ය ආයතනයක අභ්‍යන්තර විගණක තනතුර සෘජුවම ආයතන ප්‍රධානියාට වගකිව යුතු වේ.ඒ අනුව අරමුදලේ අභ්‍යන්තර විගණක ප්‍රධාන පරිපාලන නිලධාරියාට වගකියන අයුරින් සෘජුවම එම ධුරය යටතේ පැවතිය යුතු අතර එයින් සමස්ත අරමුදලම විගණනයට භාජනයට කිරීමේ අවස්ථාව උදාවේ.කෙසේ වෙතත් මෙම අරමුදලේ අභ්‍යන්තර විගණක තනතුර අධ්‍යක්ෂ(සංවර්ධන) යටතේ පෙළ ගැස්වීම අරමුදලේ අභ්‍යන්තර පාලනයට බාධා ඇතිවන්නක් බව නිරීක්ෂණය කරමු.(ඇමුණුම 42)

## සසුනෝදය වැඩසටහන්

2017 වසරේ ආරම්භ කළ මෙම ජාතික වැඩසටහනින් දිවයින පුරා වෙහෙර විහාර 13,000 ක් අදියරයන් යටතේ ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා පාලක මණ්ඩල අනුමැතිය පහත පරිදි විටින් විට ලබා ගෙන ඇත.

| අදියර | ඇස්තමේන්තු ආගමික ස්ථාන ප්‍රමාණය | අනුමැතිය දුන් පාලක මණ්ඩල පත්‍රිකා |
|---|---|---|
| 1අදියර | 150 | 204:23:01 |
| 2අදියර | 850 | 204:18:01 |
| 3අදියර | 1000 | 206:23:01 |

සත්‍ය වශයෙන් ක්‍රියාත්මක කර ඇති ප්‍රමාණය පහත දැක්වේ.

| අදියර | ප්‍රමාණය |
|---|---|
| 1 අදියර | 150 |
| 2 අදියර | 815 |
| 3 අදියර | 80 |

### සසුනෝදය වැඩසටහන ක්‍රියාත්මකභාවය නතර වීම:-

මෙහි 3 අදියර සඳහා ආගමික ස්ථාන 1000 ක් සංවර්ධනය සඳහා රු.500,000,000 ප්‍රතිපාදන පාලක මණ්ඩලය අනුමත කර තිබුණද, පඩුවස්නුවර ව්‍යාපෘතියේ ව්‍යාපෘති 19ක් ද,දඹදෙණිය ව්‍යාපෘතියේ ව්‍යාපෘති 34ක්ද, සඳහා ආධාර ලබා දී ඇති අතර 2019 ආගමික කොට්ඨාසයකින් විනාශ වූ මුස්ලිම් පල්ලි ප්‍රතිසංස්කරණය සඳහා පල්ලි 27ක්ද, සඳහා ආධාර ලබා දීමෙන් පසු මෙම වැඩසටහන දේශපාලන අධිකාරිය වෙනස්වීමෙන් පසු 2018.05.20 දිනෙන් පසු මුළුමනින් නැවතී ඇත.

### සසුනෝදය වැඩසටහන යටතේ ආගමික ස්ථාන ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා ලබා දුන් ආධාර කුරුණෑගල දිස්ත්‍රික්කයට කේන්ද්‍රිය වීම:-

2017 වර්ෂයේ ආරම්භ කළ සසුනෝදය වැඩසටහනේ 1 හා 2 අදියර යටතේ ආධාර ලබා දුන් ආගමික ස්ථාන 965 අතුරින් 316 ක්ම, එනම් 33%ක්ම,කුරුණෑගල දිස්ත්‍රික්කයේ විහාරස්ථාන වූ අතර අනෙක් දිස්ත්‍රික්කවලට මෙයට සාපේක්ෂව ඉතා අඩු ප්‍රතිශතයකින් ආධාර මුදල් ලබා දී ඇත.නුවරඑළිය, යාපනය,මන්නාරම,පුත්තලම, මුලතිව් හා කිලිනොච්චි

දිස්ත්‍රික්කවලට කිසිම ආධාර මුදලක් ලබා දී නොමැත.මේ බව විශේෂ විගණන වාර්තාවේ පැහැදිලිව සඳහන් කර ඇත.

සසුනෝදය 3 පියවර යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආගමික ස්ථාන 53කට, එනම්, පඩුවස්නුවර යටතේ 19ක්ද, දඹදෙණිය යටතේ 34ක්ද, වශයෙන් 2019.04.12 දින ආධාර ලබා දී ඇත.

ඊට අමතරව දිගන ආගමික ගැටුම් නිසා විනාශයට පත් වූ මුස්ලිම් පල්ලි 27කට 2019.07.18 දින ආධාර ලබා දී ඇත.

**කාර්යය ආරම්භ කිරීමට ප්‍රථම ව්‍යාපෘතියේ සම්පූර්ණ ඇස්තමේන්තු මුදල ගෙවීම් කිරීම:-**

සසුනෝදය වැඩසටහන යටතේ එක් එක් ව්‍යාපෘති සඳහා ආගමික ස්ථාන වලින් ලැබෙන ඉල්ලීම් මත වැඩ ඇස්තමේන්තු සඳහා රු.500,000 ට බාහිර කාර්යය ආරම්භයේදීම චෙක්පත් මගින් ඉල්ලුම්කරුට මුදල් ලබා දී ඇත.ඉල්ලීම් සහ වැඩ ඇස්තමේන්තුවක් ලබා ගෙන ඇති නමුත් කාර්යය ආරම්භයේ ව්‍යාපෘතියේ මුලු මුදලම ගෙවීම් කිරීම මුදල් රෙගුලාසි සහ රජයේ ප්‍රසම්පාදන ක්‍රමවේදයන්ට පටහැනි ක්‍රියාවකි.එසේම මූල්‍ය අක්‍රමිකතා සිදුවීමට හැකියාවක් ඇති පරිසරයක් නිර්මාණය කරන්නකි.ගෙවීමක් අනුමත කිරීමේදී කළ වැඩ වටිනාකමට හා සැපයූ බඩුවල වටිනාකම හෝ කළ සේවයේ වටිනාකමට ගෙවීම් අනුමත කර වවුචරය ඒ අනුව සහතික කර ගෙවීම් කළ යුතු බව මුදල් රෙගුලාසිවල පැහැදිලිව දක්වා ඇත.

මෙවැනි රෙගුලාසිවලට පටහැනි ගෙවීම් ක්‍රමවේදයන් නිසා කළ වැඩ පරීක්ෂා කර ගෙවූ මුදලින් නොකළ වැඩ සඳහා ගෙවීම් අයකර ගැනීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කර නොමැත.

**වැඩ නිම නොකළ සසුනෝදය ව්‍යාපෘති**

අරමුදලේ අභ්‍යන්තර විගණකගේ පරීක්ෂණ වාර්තා අනුව 3 අදියරේ පහත ව්‍යාපෘති ගෙවූ මුදලට සරිලන සේ වැඩ නිමකර නොමැති බව වාර්තා කර ඇත.

| ව්‍යාපෘතිය | ස්ථානය | නිරීක්ෂණ |
|---|---|---|
| පඩුවස්නුවර | උත්තාන මුනිඳු සම්බුදුන් දෙව්මැඳුර,කිතලව | ගොඩනැගිලි ද්‍රව්‍ය පමණක් මිලට ගෙන ඇත.කාර්යයන් නිමකර නොමැත.(පරීක්ෂණය 2022.07.25) |
| පඩුවස්නුවර | මස්ජිදුල් ජුම්යා ජුම්මා මස්ජිද් හොරම්බාව | INTERLOCK ගල් ඇතිරීමට ආධාර දී ඇත. නමුත් කාර්යයක් සිදුකර නොමැත.(පරීක්ෂණය 2022.08.29) |
| පඩුවස්නුවර | මොහිදින් තන්තියා, හොරම්බාව | ගේට්ටුව පමණක් නිමකර ඇත.ප්‍රවේශ මාර්ගයේ INTERLOCK ගල් අතුරා මාර්ග සාදා |

| | | |
|---|---|---|
| | | නැත.(පරීක්ෂණය 2022.08.29) |
| පඩුවස්නුවර | රිෂාද්මස්ජිද් හස්තම්පල,සියඹලාගස්කොටුව | පැති බැම්මක් තැනීමට ආධාර දී ඇත.අත්තිවාරම පමණක් සිදුකර ඇත.(පරීක්ෂණය 2022.07.29) |

**පුරාවිද්‍යා කොමසාරිස්ගේ අවසරයකින් තොරව සංවර්ධනය සඳහා ආධාර ලබා දීම**

1940 අංක 09 පුරාවස්තු ආඥාපනතේ 2(1) වගන්තිය ප්‍රකාර පුරාවිද්‍යා කොමසාරිස්ගේ අවසර පත්‍රයකින් හැර පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති ස්ථාන සංවර්ධනය කළ නොහැකිවූවත් සසුනෝදය වැඩසටහන යටතේ එකී නීති රීති වලට පටහැනිව එසේ අවසර පත්‍ර නොලබා පහත සඳහන් ස්ථාන සංවර්ධන සඳහා අවසර ලබා දී ඇති බව විශේෂ විගණකාධිපති වාර්තාවේ සඳහන් වේ.(අභ්‍යන්තර විගණකගේ ප්‍රකාශය මගින්ද සනාථ වී ති බව තහවුරු කල යුතුය)

| විහාරස්ථානයේ නම | පුරාවිද්‍යාත්මක වටිනාකම |
|---|---|
| වේයන්ගොඩ ශ්‍රී බෝධිරුක්ඛාරාමය පුරාණ විහාරය | 1984.04.06 ගැසට් පත්‍රයකින් පුරාවිද්‍යා ස්මාරකයක් ලෙස නිවේදනය කර ඇත. |
| කුරුණෑගල,ගල්ගමුව බුදුරුවකන්ද රජමහා විහාරය | වැම්පිට විහාරයකි. |
| කුරුණෑගල, ශ්‍රී මහමුණි පුරාණ විහාරය | වැම්පිට විහාරයකි. |
| ශ්‍රී වික්‍රමසිංහ අභයතිලක රත්නාරාමය | පුරාවිද්‍යා ආරක්ෂිත ස්ථානයකි. |

**සසුණෝදය වැඩසටහන සම්බන්ධයෙන් පහත කරුණු තවදුරටත් නිරීක්ෂණය වේ.**

I. මේ සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

II. ඇස්තමේන්තු සෑදීම ප්‍රතිපාදන ලබා ගත් ආයතන විසින්ම සිදුකර ඇත.

III. සියලුම ප්‍රතිලාභී ආගමික ආයතන වලට අදාල ඉල්ලීම් ඉදිරිපත් කිරීම සඳහා විවෘත ක්‍රමවේදයක් හඳුන්වා දීම පුවත්පත් ජනමධ්‍ය හෝ වෙබ් අඩවි හරහා අයදුම්කරුවන්ට තම ඉල්ලීම් ඉදිරිපත් කිරීමේ අවස්ථාව සලසා දී නොතිබූ බව කමිටුව නිරීක්ෂණය කරයි.

IV. ඉදිකිරීම් සම්බන්ධයෙන් පසුවිපරම් වැඩ පිළිවෙලක් හෝ කාලීන වැදගත්කම සම්බන්ධයෙන් සමාලෝචන වැඩ පිළිවෙලක් යොදා නොතිබූ බව තවදුරටත් නිරීක්ෂණය වේ. නිසියාන්ත්‍රණයක් උපයෝගී කරගනිමින් ඉල්ලුම්කරුවන්ගේ සැබෑ අවශ්‍යතාවය සහිත ආගමික ස්ථාන තෝරා ගැනීමේ ක්‍රමවේදයක් අනුගමනය කිරීමට කටයුතු නොකිරීම තෙවන අදියරේ අසාර්ථකත්වයට බලපෑ බව නිරීක්ෂණය වේ.

V. සාමාන්‍යයෙන් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේදී එහි පළමු අදියර තරමක් අඩු ප්‍රගතියක් දක්නට ලැබෙන අතර දෙවන අදියරේදී එහි අඩුපාඩු හඳුනාගනිමින් පළමු අදියරට වඩා වැඩි සාර්ථකත්වයකින් හා ඊළඟ අදියරවල එය උපරිම ඵලදායිතාවයක් ඇතිවන අන්දමින් ක්‍රියාත්මක වීම සාමාන්‍ය ස්වභාවය වුවද මෙම සසුනෝදය ව්‍යාපෘතියේ තුන්වන අදියර සම්බන්ධයෙන් එලෙස සිදුවී නොමැත.

VI. මෙලෙස තුන්වන අදියරේ වැඩ සටහන පසුගාමී තත්වයකට පත්ව ඇත්තේ අමාත්‍යවරයාගේ වෙනස් වීම සහ නව සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශ ලේකම්වරයකු යටතේ අරමුදල ක්‍රියාත්මක වීම නිසා බව නිරීක්ෂණය වේ. සසුනෝදය පළමු සහ දෙවන අදියර ක්‍රියාත්මක වීමේදී අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ අරමුදල පවතින විට එකී අමාත්‍යාංශයේ ලේකම්වරයා කිසිදු අයුරකින් සසුනෝදය වැඩසටහනට දායක නොවූ බව කමිටුව හමුවේ ප්‍රකාශයක් ලබා දෙමින් පවසා ඇත.

සසුනෝදය I, II, පසු විපරම් වාර්තා ව්‍යාපෘති කළමනාකරුවන් මගින් ගෙන්වා ගැනීමට සැලසුම් කර තිබුනද එය එසේ සිදුවී නොමැති බවත් තුන්වන අදියර කිසිදු පසු විමර්ශනයක් සම්බන්ධයෙන් වැඩ පිළිවෙලක් තිබූ බවට වාර්තා නොවන බවත් ව්‍යාපෘතිය අතරමග නතර කර දැමීමෙන් පසු කලෙක විගණකාධිපතිවරයාගේ විශේෂ විගණන වාර්තාවෙන් පසු අරමුදලේ අභ්‍යන්තර විගණකගේ මැදිහත්වීමෙන් අනතුරුව මේ සම්බන්ධයෙන් පසු විපරම් සිදුවී ඇති බවත් නිරීක්ෂණය වේ.

සසුනෝදය වැඩසටහන යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ශාන්ත ජෝසප් දේවස්ථානය, හෝ ලිරෝයෝ දේවස්ථානය, අලිසෙන් ලෝඩ් දේවස්ථානය, සහ ශාන්ත තෙරේසා දේවස්ථානය යන ආගමික ස්ථාන හතර සඳහා චෙක්පත් එකම බැංකු ගිණුමකට බැර කර තිබීම පිළිබඳ විශේෂ විගණනයේදී කරුණු දක්වා තිබීම කමිටුවේ විමසීමට ලක්වූ අතර එහිදී හෙළි වූයේ එකී දේවස්ථාන එකම මීසමකට අයත් බැවින් එම මීසමට අයත් බැංකු ගිණුමට මුදල් චෙක්පත් මගින් බැර කර ඉන්පසු එම මීසම මගින් අදාළ දේවස්ථාන වලට මුදල් මුදා හැර ඇති බවයි. ඒ අනුව එම ක්‍රියාවලියේ දෝෂයක් සිදුවී නොමැති බව නිරීක්ෂණය කෙරේ.

සසුනෝදය I, II, III වන අදියරයන් සම්බන්ධයෙන් ලැබුනු තොරතුරු සාම්පලය අනුව පළමු අදියරෙහි පසු විපරම් වාර්තා නිසි පරිදි ප්‍රධාන කාර්යාලයට එවා ඇති අතර ඒවාට අදාළ ඉල්ලීම් ලිපි ද තිබී ඇත. එහෙත් දෙවන අදියර සම්බන්ධයෙන් එවැනි ඉල්ලීම් එවා නොමැති බව පරීක්ෂා කරන ලද සාම්පල අනුව පෙනී යයි.

එම වාර්තාවල පසු විපරමට අදාළ තොරතුරු නොමැති වුවත් ඉල්ලීම් ලිපි තිබූ බවට සටහනක් පමණක් වාර්තාකර ඇත. තුන්වන අදියර සඳහා ඉල්ලීම් ලිපි මුස්ලිම් දේවස්ථාන වලින් ලබා දී තිබූ අතර එම පරීක්ෂාවට ඉදිරිපත් වූ ස්ථාන 34 සම්බන්ධයෙන්ම පසු විපරම් වාර්තා 2018/2/23 දිනැති අධ්‍යක්ෂ (ආගමික හා කලා කටයුතු) ඩී.එම්.ඩී. දිසානායක මහතාගේ අත්සනින් නිකුත් කල ලිපියට අනුව සපයා නොමැති බව පරීක්ෂාවට භාජනය වූ සාම්පලයෙන් අනාවරණය වේ.

2018/03/12 වන දිනැතිව දඹදෙණිය ව්‍යාපෘතියට යවා ඇති ලිපියට අනුව යෝජිත ව්‍යාපෘති ප්‍රදේශයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් ස්ථානයක්ද යන්න විමසා වාර්තා කරන ලෙස දන්වා ඇතත් ඊට පිළිතුරු එවූ බවට කරුණු වාර්තා නොවීය. මෙම ව්‍යාපෘති 34 ම මුස්ලිම් දේවස්ථාන වීමද සුවිශේෂ කරුණක් බවට නිරීක්ෂණය වේ. එමෙන්ම 2017.11 සහ දින රජිතව ගරු ස්වාමීන් වහන්සේ/ගරු අමාත්‍යතුමන් /පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන් පළාත්සභා මන්ත්‍රීතුමන් හා ආසන සංවිධායකතුමන් වෙත මෙම ව්‍යාපෘතිය පිළිබඳව ගරු

අධ්‍යාපන විෂය භාර අමාත්‍යතුමා විසින් බෞද්ධ විහාර 13000 සංරක්ෂණය සහ සංවර්ධනය කිරීමේ ලිපියක් මේ සම්බන්ධයෙන් යවා ඇති බව අනාවරණය වේ. (ඇමුණුම් 42)

මෙම ව්‍යාපෘතිය ගරු අග්‍රාමාත්‍යතුමාගේ මගපෙන්වීම අනුව සිදුවන බව එහි සඳහන් වේ. මේ අනුව බෞද්ධ වෙහෙර විහාර සංරක්ෂණය අරමුණු කරගත් මෙම ව්‍යාපෘතිය පොදු අරමුදල් මගින් ක්‍රියාත්මකවන ව්‍යාපෘතියක් වශයෙන් අත්‍ය ආගම් නියෝජනයක් සිදු නොවී ඇති බවද නිරීක්ෂණය වේ.

**සිසු දහම් සෙවණ වැඩසටහන:**

208 වන පාලක මණ්ඩලය විසින් දිවයින පුරා දහම් පාසැල් ගොඩනැගිලි 332 ක් ඉදිකිරීමටත් එම ගොඩනැගිලි එකම සැලැස්මක් යටතේ පෙර සවිකුමය යටතේ ඉදිකිරීමටත් අනුමැතිය ලැබී ඇති අතර එක් ගොඩනැගිල්ලක් සඳහා මිලියන 3.2 ක (වැට් සහිතව) උපරිමයකට යටත්ව ප්‍රතිපාදන සැලසීමටද අනුමැතිය ලැබී ඇත.

1. මෙම වැඩසටහන අත්‍යවශ්‍ය හදිසි වැඩසටහනක් වශයෙන් ක්‍රියාත්මක කළ යුතු බවට තීරණය කිරීමට සාධාරණ යුක්තිසහගත හේතු කමිටුවට ඉදිරිපත් නොවීය.

2. එමෙන්ම මුලදී ප්‍රාදේශීය ලේකම්/දිස්ත්‍රික් ලේකම්වරුන් හරහා ක්‍රියාත්මක කිරීමට චක්‍රලේඛ පවා නිකුත් කර තිබියදී පසුව අරමුදලේ සම්බන්ධීකරණ නිළධාරීන් යොදවා ඔවුන් මගින් ප්‍රාදේශීය ලේකම්වරුන් හරහා මෙය නිර්දේශ කර ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බව නිරීක්ෂණය විය.

3. දිවයින පුරා ඉතා කෙටි කලෙක දී අදියර තුනක් යටතේ ගොඩනැගිලි 332 ක් ඉදිකිරීමට සැලසුම් කළද, එය ප්‍රායෝගිකව මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රාදේශීය ව්‍යාපෘති නිළධාරීන් සම්බන්ධ කර නොගෙන ක්‍රියාත්මක වී ඇති බව නිරීක්ෂණය විය.

4. අමාත්‍යාංශය යටතේ ඇති සියලුම ඉදිකිරීම් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව හරහා ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාව , රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව යන ආයතන මගින් ඉදිකොට භාරදීමේ ක්‍රමවේදය හරහා ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇති බවත් ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බවත් නිරීක්ෂණය වේ.

5. මේ සම්බන්ධයෙන් අරමුදලට සම්බන්ධ ප්‍රධාන පරිපාලන නිළධාරීගෙන් විමසීමේදී මේ ව්‍යාපෘති 332 වෙන් වෙන්ව එකක් රුපියල් මිලියන 3.2 උපරිමයකට යටත්ව ඉදිකල වෙන් වෙන් ව්‍යාපෘති බැවින් පාලක මණ්ඩලයේ අනුමැතිය ප්‍රමාණවත් බවත් මුදල් රෙගුලාසි වලට පටහැනිව කටයුතු කර නොමැති බවත් ය. කෙසේ වුවද මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට රජයේ ඉදිකිරීම් ආයතන වලට මුල්‍ය ප්‍රතිපාදන නිකුත් කිරීමේදී ව්‍යාපෘති සියල්ල එක් තොගයක් වශයෙන් සලකා ගෙවීම් කර ඇති බව නිරීක්ෂණය විය.

6. රාජ්‍ය සංස්ථා වල මූල්‍ය තත්වය ශක්තිමත් කිරීමේ අරමුණෙන් එම සංස්ථා හරහා ඉදිකිරීම් කරවා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇති බවද නිරීක්ෂණය වේ.

7. මෙම ඉදිකිරීම්ද මධ්‍යම සංස්කෘතික අරමුදල් එනතෝ පූර්විකාවේ සඳහන් "ආගමික සහ සංස්කෘතික කටයුතු සංවර්ධනය කිරීමේදී දරණ ලද වියදම් ප්‍රයවීම" යන වාක්‍ය ඛණ්ඩය උපයෝගී කර ගනිමින් අරමුදලේ ප්‍රධාන පරමාර්ථයෙන් බැහැරව "සසුනෝදය ව්‍යාපෘතිය" මෙන්ම සිදුකල ව්‍යාපෘතියක් බව තවදුරටත් නිරීක්ෂණය වේ.

8. මේ සම්බන්ධයෙන් පසු මිනුරම් ක්‍රියාවලියක් අමාත්‍යාංශයේ සැලසුම් අංශය විසින් අඛණ්ඩව සිදුකර ඇති බවට කරුණු හෙළිවේ.

9. Design & Built යන ක්‍රමවේදය ඔස්සේ අමාත්‍යාංශය යටතේම පවතින ආයතන දෙකක් හරහා ක්‍රියාත්මක කල ව්‍යාපෘතියක් බැවින් ප්‍රගතිය පරීක්ෂාවට සහ අධීක්ෂණයද කොන්ත්‍රාත්කාර සංස්ථාවටම පැවරී ඇති බව නිරීක්ෂණය වේ.

10. මෙම සංස්ථාවලට අත්තිකාරම් ගෙවීමේදී 20% කට වඩා වැඩි මුදලක් මුදා හැරීමෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අභිබවා කටයුතු කර ඇති බවද නිරීක්ෂණය වේ.

11. සසුනෝදය වැඩසටහන් මෙන්ම සිසු දහම් සෙවණ වැඩසටහනද තුන්වර අදියරේදී අතරමග නතර කර ඇති බවද නිරීක්ෂණය වේ.

12. මෙසේ තුන්වන අදියර අතරමග නතරවී ඇත්තේ දේශපාලන අධිකාරිය මෙන්ම අමාත්‍යාංශ ලේකම් වෙනස්වීම සහ භාණ්ඩාගාරයේ නිළධාරීන් විසින් වියදම් නතර කිරීමට දෙන ලද උපදෙස් මත බව ලිඛිත සාක්ෂි මගින් මෙම කමිටුවට අනාවරණය වී ඇත.

13. ආරම්භයේදී සැලසුම් කර තිබුණේ දහම් පාසල් ගොඩනැගිලි 332 ක් වුවද, පසුව පලමුවන අදියරේ ගොඩනැගිලි 45 ක්ද, දෙවන අදියරේදී ගොඩනැගිලි 209 ක්ද, සහ තුන්වර අදියරේදී ගොඩනැගිලි 114ක්ද වශයෙන් මුලු ගොඩනැගිලි ප්‍රමාණය 368 දක්වා ප්‍රමාණය වැඩිකරගෙන තිබූ බවද නිරීක්ෂණය වේ.

14. ඉදිකිරීම් කටයුතු සඳහා අත්තිකාරම් වශයෙන් ආයතන තුනට රුපියල් 753,500,000/- ගෙවා ඇති බවද නිරීක්ෂණය වේ.

එහෙත් මෙම සියලුම කොන්ත්‍රාත් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට හා රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවට පවරා ඇත්තේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව හරහා වේ.ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව අතර සෑම ව්‍යාපෘතියක් සම්බන්ධයෙන්ම ගිවිසුමක් පැවති බවත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ඒ සඳහා තෝරා ගෙන ඇත්තේ මුදල් රෙගුලාසි වලට අනුකූලව එවකට ඉදිකිරීම් සම්බන්ධ රජයේ ආයතනය ලෙස පැවති රජයේ වැඩ දෙපාර්තමේන්තුව වෙත පැවරීමට හැකි බවට තිබූ ප්‍රතිපාදනම ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ආදේශ කර ගැනීමට කටයුතු කරගෙන ඇති බවට හිටපු ලේකම් බර්නාඩ් වසන්ත මහතා කමිටුවට ලබා දුන් ප්‍රකාශය අනුව කමිටුවට පිළිගැනීමට තරම් කරුණු ඉදිරිපත් විය.

විගණන වාර්තාවේ සඳහන් වී ඇති පරිදි එහි ඇමුණුම 21 හි සඳහන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මුදල් ඇමතිතුමාගේ නිරීක්ෂණයන්ට අනුගතව කටයුතු කොට නැවත ඉදිරිපත් කරන ලෙස දැන්වීමට තීරණය කර ඇත. එහෙත් එම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අදාළව සංශෝධිත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කර නැත.

මේ සම්බන්ධයෙන් මධ්‍යම සංස්කෘතික අරමුදල වෙනුවෙන් ප්‍රකාශ ලබා දුන් එවකට අමාත්‍යාංශ ලේකම් මෙන්ම ප්‍රධාන පරිපාලන නිළධාරී බර්නාඩ් වසන්ත මහතාගේ ප්‍රකාශයෙන්ද මුදල් අධ්‍යක්ෂ (වැ.බ.) ආරියරත්න මහතාගේ ප්‍රකාශයෙන් ද කරුණු දක්වා සිටියේ මෙම ව්‍යාපෘති සියල්ලේම වටිනාකම මත අමාත්‍ය මණ්ඩලයට අනුමැතිය සඳහා ඉදිරිපත් කල යුතු බවට විගණන නිළධාරීන් විසින් ලබා දුන් නිරීක්ෂණ අනුව එසේ අමාත්‍ය මණ්ඩලය වෙත පත්‍රිකාවක් ඉදිරිපත් කලද එක් එක් ව්‍යාපෘතිය මිලියන 3.2 ක් උපරිම වටිනාකමින් යුත් වැඩසටහනක් වූ බැවින් එසේ අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන බවත් එය පාලක මණ්ඩල අනුමැතිය මත සිදු කල බවත් ය.

මෙහිදී අදාළ පාලක මණ්ඩලයේ අනුමැතිය ලැබුනේද යන්න සලකා බැලීමේදී එය පාලක මණ්ඩල සාමාජිකයින් සියලු දෙනාම සිය අත්සන් තබා අනභිමුඛව පත්‍රිකාව අනුමත කරන ලද බව අත් අකුරු පිළිබඳ රජයේ රස පරීක්ෂකගේ වාර්තාවේ සඳහන් පරිදි පාලක මණ්ඩල සාමාජිකයින්ගේ නිර්ව්‍යාජභාවය තහවුරු වී ඇති බැවින් ඉහත පාලක මණ්ඩල අනුමැතිය ලැබුණා සේ සැලකීමට කමිටුවට කරුණු ඉදිරිපත් විය.

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලින් බැහැරව යෑමට හැකි වන අන්දමින් පනතේ වගන්ති වැරදි අර්ථ නිරූපණයට පාලක මණ්ඩලයේ අනුමැතිය මත පමණක් මෙසේ සුවිශාල මුදල් ප්‍රමාණයක් වියදම් කර ගැනීමට හැකිවීම ඉතා අයහපත් මූල්‍ය පරිචයන්ට මග පාදා ඇති බව කමිටුවේ මතය වේ. මේ අනුව පාලක මණ්ඩලයට එවැනි මුදල් වියදම් කිරීමට බලයක් නීතිමය වශයෙන් තිබේද යන්න විශේෂයෙන් විමසීමට ලක් කල යුතු කරුණක් බව නිරීක්ෂණය කරමු.

• ගොඩනැගිලි දෙපාර්තමේන්තුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, සහ රාජ්‍ය සංවර්ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාව යන ආයතන මගින් මෙම ඉදිකිරීම් කරවා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉදිකිරීම් අමාත්‍යාංශයට ලැබී තිබූ අතර මිල ගණන් කැඳවීමකින් තොරව ස්ථාවර කමිටුවේ ගාස්තු අනුපාතයන් මත මිල තීරණය කිරීමටද අවසරය ලැබී තිබුණි. ඒ අනුව මෙම ඉදිකිරීම සඳහා අමුද්‍රව්‍ය ශ්‍රමය සහ අනෙකුත් වියදම් ස්ථාවර කමිටුව මගින් ගණනය කොට මිල තීරණය කිරීමට කටයුතු කර ඇති බැවින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශයෙන් බැහැර වීම පිණිස විශේෂ අනුමැතියක් මත කටයුතු කර ඇති බව කමිටුව පිළිගනී.

• ජාතික වැඩසටහනක් වශයෙන් දහම් පාසැල් ඉදිකිරීමේදී ඉල්ලුම් කිරීම සඳහා ප්‍රසිද්ධ දැන්වීම් හෝ වෙනත් මාධ්‍යකින් දැනුවත් කළ බවට සාධක ඉදිරිපත් නොවූ අතර එය මුල් අදියරේදී කොළඹ සහ මාතර දිස්ත්‍රික්ක හැර ක්‍රියාත්මක කොට ඇති බවත් දෙවැනි අදියරේදී එම දිස්ත්‍රික්ක දෙකද ඊට ඇතුලත් කොට ඇති බවත් පෙනී යයි.

• මධ්‍යම සංස්කෘතික අරමුදල සතුව ව්‍යාපෘති කාර්‍යාල 25 ක් පමණ තිබියදී ඔවුන් මෙම වැඩපිළිවෙලට බද්ධ කර නොගැනීම හා ඒ සඳහා වෙනම සම්බන්ධීකරණ නිළධාරීන් යොදවා ඔවුන් මගින් දහම් පාසැල් ගොඩනැගිලි ඉදිකිරීමට සුදුසු ස්ථාන තෝරා ගැනීම කමිටුවට ගැටළු සහගත විය. මුලින් දිස්ත්‍රික් ලේකම්වරයා හරහා පවත්නා රාජ්‍ය යාන්ත්‍රණය තුලින් ඉටු කර ගැනීමට තිබූ ක්‍රමවේදයෙන් බැහැරව වෙනත් කණ්ඩායමක් යොදා ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කිරීමට හේතු වශයෙන් වැඩසටහන ඉක්මනින් නිම කිරීමේ අවශ්‍යතාවය බලපෑ බව එවකට අමාත්‍ය ලේකම් වූ බර්නාඩ් වසන්ත මහතා කරන කරුණු දැක්වීම පරිපාලන ක්‍රමවේදයන් අනුව එකඟවිය හැකි තත්වයක් නොවේ. එසේම එම වැඩසටහන කඩිනම් කිරීමේ අවශ්‍යතාවය කුමක්ද යන්න කමිටුවට අනාවරණය වූයේ නැත.

ුඹර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම්වරුන් නිර්දේශිත දහම් පාසැල් ගොඩනැගිලි නිශ්චිතව එම නාම ලේඛනවල ඇතුලත් නොවූ දහම් පාසැල් පහක් ඉදිකර ඇති බවට ට තොරතුරු ලැබී ඇති අතර එම දහම් පාසැල් පහ සඳහා අමාත්‍යවරයාට වෙනමම ඉදිරිපත්ව තිබූ බවට කරුණු ඉදිරිපත් විය. මෙම කරුණ විශේෂ විගණන වාර්තාවේද ් වේ.

ාඩු සහිතව දහම් පාසැල් ගොඩනැගිලි බාරදී ඇති බවට විගණනය විසින් පෙන්වා දී රුණට අදාළව design & built ක්‍රමය යටතේ ඉදිකරන ලද ගිවිසුම අනුව හය මසක් (6) එවැනි අඩුපාඩු ඇත්නම් නිවැරදි කර ගැනීමේ හැකියාව ඇති බවට අමාත්‍ය ලේකම් ඩ් වසන්ත මහතාගේ ප්‍රකාශයේ සඳහන් වේ. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සහ රාජ්‍ය ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාව සමග අතුලත්ව ඇති ගිවිසුමේ එවැනි ්දේසියක් ඇතුලත්ව ඇත.

ද්‍රා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛ පරිදි ස්ථාවර ගොඩනැගිලි ඉදිකිරීමේදී ා ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ අනුමැතියක් අවශ්‍ය දිස්ත්‍රික්ක දහයක එබඳු ්ම් 147 ක් සඳහා අනුමැතිය ලබා ගැනීමක් කර නොමැති බව නිරීක්ෂණය වේ. මෙය ්නැගිලි දෙපාර්තමේන්තුවේ/රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ/රාජ්‍ය සංවර්ධන සහ ාණ නීතිගත සංස්ථාවේ කාර්‍යභාරයක් බව පෙනේ. මෙම ආයතන තුනම අයත් වන ාත්‍යාංශ ලේකම්වරයා වන්නේ මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රධාන පරිපාලන නිලධාරී ාඩ් වසන්ත මහතාම වන අතර ඒ පිළිබඳ අධීක්ෂණමය වගකීමක් ඔහු විසින් සිදුකර ැති බව පැහැදිලි වේ.මෙම තත්වය පිලිබඳව විගණකාධිපති විසින් 2019/08/27 දිනැති ්ත විමසුමෙන් පෙන්වා දීමෙන් පසුව හෝ ඒ කෙරෙහි අවධානය යොමු නොකරමින් රීම් කටයුතු සිදුකර ඇති බව පෙනේ.

ිමිත ගොඩනැගිලි භාරදීම හා බාර ගැනීම සඳහා විධිමත් අකෘති පත්‍රයක් හඳුන්වා දී අතර භාරදීම හා භාර ගැනීමටත් යම් අඩුපාඩු පවතී නම් ඒ බවට සටහන් කිරීමටත් අකෘති පත්‍රයේ ඉඩකඩ වෙන් කර ඇත. එහි ආදර්ශ ලේඛනයක් ඇමුණුම් 43 වශයෙන් ුණු කොට මෙම වාර්තාව සමග ඉදිරිපත් කෙරේ.

කළ සිසු දහම් සෙවන ගොඩනැගිලි අරමුණු වලට පටහැනිව භාවිතා කිරීම පිලිබඳව වුවේ නිරීක්ෂණය වන්නේ පවතින රාජ්‍ය යාන්ත්‍රණය වූ ව්‍යාපෘති කාර්‍යාල හරහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් බැහැරව බාහිර කණ්ඩායමක අවශ්‍යතාවය මත සිදුකර ් එමෙන්ම අවශ්‍ය ප්‍රතිලාභීන්ගේ ඉල්ලුම් මත පදනම් නොවූ (demand driven) ල්පයෙන් බැහැරව අනුගමනය කරන ලද ක්‍රමවේදය නිසා මෙබඳු තත්වයක් ඇතිවී ඇති කමිටුව නිරීක්ෂණය කරයි.

ය ක්‍රමවේදයේ වරදක් මෙන්ම ප්‍රතිලාභීන් දැනුවත් කොට භාවිතය හා පසු නඩත්තුව හා වැඩපිළිවෙල ඔවුන්ට හඳුන්වා දීමට කටයුතු නොකිරීම තුල උද්ගත වී ඇති තත්වයක් ද නිරීක්ෂණය වේ. මෙබඳු ප්‍රජාව හා සමීප සම්බන්ධ ව්‍යාපෘතියකදී ප්‍රතිලාභී ප්‍රජාවගේ ය සහ ශ්‍රම දායකත්වය ලබා ගැනීම හා ප්‍රතිලාභීන් දැනුවත් කිරීමේ අවශ්‍යතාවයෙන් ව්‍යාපෘතිය බැහැර වීම අයහපත් ප්‍රතිඵලයක් බව තවදුරටත් පෙනී යයි.

ුරුණෑගල දිස්ත්‍රික්කයේ විහාරස්ථාන දහයක කටයුතු අවසන් නොමැති බවට විගණනය ින් දක්වන කරුණු දැක්වීම සම්බන්ධයෙන් පිළිගත හැකි සාධාරණ හේතුවක් ඉදිරිපත් ාවීය.

## ආගමික හා කලා අංශය

2017 සිට 2020 දක්වාම ක්‍රියාත්මකව පැවති ආගමික හා කලා කටයුතු අංශය 2017 මැයි මස එවකට සිටි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 202.39.01 දරණ පාලක මණ්ඩල පත්‍රිකාවේ අනුමැතිය මත මෙම අංශය ස්ථාපිත කර ඇත. අරමුදලේ කාර්යභාරය පුරාවිද්‍යා ස්ථාන 29 ක සංවර්ධනය කිරීම දක්වා පුළුල්වීම පෙර වර්ෂ වලට වඩා එය දෙගුණයකින් වැඩිවීමක් බව පෙන්නුම් කරන අතර 2017 වර්ෂයේ ආරම්භ කරන ලද බෞද්ධ විහාර 13000 ක වැඩසටහන ගරු අග්‍රාමාත්‍යවරයාගේ ආශීර්වාද මත විෂය භාර අමාත්‍යවරයා විසින් දිවයින පුරා එය ක්‍රියාත්මක කිරීමට අදාලවත් මෙබඳු අංශයක් සැබෑ අවශ්‍යතාවය පැවති බව කමිටුව පිළිගනී. එහෙත් මේ සඳහා කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත මු.රේ. 71 යටතේ ඉල්ලුම් කිරීමෙන් අනතුරුව ආයතන අධ්‍යක්ෂ ජනරාල්, වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නියෝජනයත් යුත් කමිටුවක නිරීක්ෂණ මත අනුමත කර ගත යුතු කාර්යමණ්ඩලයක් බව නොසලකා 1980 අංක 57 දරන පනතේ 4(ඉ) වගන්තියට වැරදි අර්ථ නිරූපණයක් ලබා දෙමින් රීති සෑදීමට ඇති බලය සේවකයින් බඳවා ගැනීමට ඇති බලයක් සේ සලකා කටයුතු කර ඇති බව පෙනේ. මෙම බඳවා ගැනීමේ ක්‍රමය නිවැරදි බවට 2017 වර්ෂයේ සිට මෙම කමිටුව විමර්ශනය කරන අවස්ථාව දක්වාම එහි ප්‍රධාන පරිපාලන නිළධාරී අධ්‍යක්ෂ (මුදල්) හා සමහර පාලක මණ්ඩල සාමාජිකයින්ගේ ද මතය වී තිබූ බව කමිටුවට අනාවරණය විය. එහෙත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි අනුගමනය කිරීමට ඔවුන් බැඳී ඊත බවටද ඔවුන් තුල අවබෝධයක් තිබූ බව නිරීක්ෂණය විය . මේ අනුව 2017 සිට 2020 දක්වාම ආගමික හා කලා කටයුතු අංශය සඳහා 2017,2018,2019, 2020 යන වර්ෂ හතරේදීම නිළධාරීන් බඳවා ගෙන ඇත්තේ පාලක මණ්ඩලයේ අනුමැතිය මත බවට කරුණු අනාවරණය විය. එහෙත් මෙය අරමුදලේ නිළධාරීන් විසින් සිය බලතල අභිබවායමින් කටයුතු කර ඇති අවස්ථාවක් බවද මේ පිළිබඳව පාලක මණ්ඩල සාමාජිකයින් දැනුවත් නොකිරීම මෙන්ම විෂය භාර අමාත්‍යවරුන් හා අග්‍රාමාත්‍යවරයා ප්‍රමුඛ පාලක මණ්ඩලය දැනුවත් නොකිරීමද නිළධාරීන් විසින් සිය වගකීම මගහැර යෑමක් බව කමිටුව නිරීක්ෂණය කරයි.

අදාළ කාලසීමාව වූ වසර හතර තුල පාලක මණ්ඩල අනුමැතිය මත කාර්යමණ්ඩලයට අරමුදලින් වේතන දීමනා හා වෙනත් පාරිශ්‍රමික මෙන්ම පාලන වියදම්ද දරා ඇති අතර එම ගෙවීම් නීත්‍යානුකූල නොවන ගෙවීම් බවත් එවැනි තනතුරු සඳහා වැටුප් තීරණය කිරීමේදී අධ්‍යක්ෂ තනතුරු සඳහා යෝජිත වැටුප් ගෙවීමට තීරණය කිරීමටත් පාලක මණ්ඩලය අනුමැතිය ලබා දීම පිළිබඳව කමිටුවේ අවධානය යොමු විය. කෙසේ වෙතත් මෙය වැරදි පූර්වාදර්ශයක් ලෙස 2020 දක්වා ක්‍රියාත්මක වීම මගින් මෙම අයහපත් තත්ත්වය එම අංශය ක්‍රියාත්මක වීම නතර කරන තුරුම පැවති බව පෙනී යයි.

ිසුදහම් සෙවණ නිම නොවූ වැඩ සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදල ගෙවා ඇති
මුදල ගණනය

ක්‍රියාත්මක ඇරඹූ ව්‍යාපෘති සංඛ්‍යාව - 368

0%නිම කළ ව්‍යාපෘති සංඛ්‍යාව - 222

146

ැඩ ආරම්භ නොකළ ව්‍යාපෘති සංඛ්‍යාව - (20)

ැඩ අතරමග නැවතුනු ව්‍යාපෘති සංඛ්‍යාව - 126

ාක්ෂණික කමිටුව ඒකකයට අනුමත කළ මිල - රු.2974901.90 (ඇමුණුම්45)

%VAT සමග ඒකකයක මිල - රු. 2974901.90X108 / 100

- රු. 3212894.05

ිමකළ ඒකක 222හි මිල - රු. 3212894.05 X 222

- රු. 713262479.00

ධ්‍යම සංස්කෘතික අරමුදල මුළුමනින්ම ගෙවා ඇති මුදල - රු. 753500000.00

ේ අනුව අතරමග වැඩ නැවතුනු ව්‍යාපෘති 126 සඳහා ගෙවා ඇති මුදල -රු. 753500000.00

(713262479.00)

40237521.00

ේ අනුව සිසුදහම් සෙවණ වැඩසටහන් නිම නොවී අතරමග වැඩ නැවතුනු ව්‍යාපෘති 126 දහා මධ්‍යම සංස්කෘතික අරමුදල ගෙවා ඇති මුදල රු. 40237521.00 වේ.ඉතිරි මුදල ර්තමාන මිල ගණන් අනුව ගෙවන්නේ නම් වැඩ අවසන් කල හැකි බව සංස්ථාවේ ියෝජිතයින් කමිටුව හමුවේ කරන ලද ප්‍රකාශයේ සඳහන් වේ.

**ද්ශපාලන අධිකාරිය වෙනස්වීමත් සමග මෙතෙක් කරගෙන ආ විශේෂ යාපෘති නතරවීම නිසා ජාතික සම්පත් අපතේ යැමට සැලැස්වීමක් බව.**

17 වසරේ ආරම්භ වූ සඳහුනෝදය වැඩසටහනෙන් දිවයින පුරා වෙහෙර විහාර 1300ක් තිසංස්කරණය හා සංවර්ධනය අරමුණු කරගෙන ආරම්භ කර ඇත.මේ අනුව අදියර ශයෙන් ක්‍රියාත්මක වූ මෙම වැඩසටහන 1,2 හා 3 අදියරේ ආගමික ස්ථාන 1045 ක කටයුතු ංවර්ධනය සඳහා මූල්‍යාධාර ලබා දී ඇත.ඒ සඳහා පාලක මණ්ඩලයෙන් අදියර වශයෙන් ු මිලියන 975ක් අනුමත කරගෙන ඇත.

| අදියර | පාලක මණ්ඩලයෙන් අනුමත කළ මුදල රු |
| --- | --- |
| 1 | 50,000,000 |
| 2 | 425,000,000 |
| 3 | 500,000,000 |
| | 975,000,000 |

කෙසේ වෙතත් 2018 වසරේ දේශපාලන අධිකාරියේ වෙනස්වීමත් සමග මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම මුළුමනින්ම ඇණහිට ඇත.එනමුත් මෙම වැඩසටහන සැලසුම් කිරීම මූලික කටයුතුවලට සම්බන්ධ සාකච්ඡා හා මෙහෙයවීම් කටයුතුවලට අනිවාර්යයෙන්ම විශාල පිරිවැයක් දරනු ලැබ ඇත.සමස්ත කාර්යය මණ්ඩලය මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට මෙහෙයවා ඇත.එසේම සන්නිවේදන කටයුතු විවිධ අයුරින් සිදුකර ඇත.

මෙවැනි ජාතික වැඩසටහනක් දේශපාලන අධිකාරිය වෙනස්වීමත් සමග නතරවීම ඉහත පරිදි දරන ලද සියලු සැලසුම් අතරමග නතරවීමක් වන අතර ඒ සඳහා දරන ලද සියලු වියදම් අපතේ යැවීමක් බව කමිටුව නිරීක්ෂණය කරයි.

2018 වසරේ නව දේශපාලන අධිකාරියෙන් ආරම්භ වූ සිසුදහම් සෙවණ වැඩසටහනින් විසින් පුරා දහම් පාසල් ගොඩනැගිලි 370ක් ගොඩනැගීම සඳහා සැලසුම් සකස්කර ඒ සඳහා කාර්යය මණ්ඩලය මෙහෙයවා ඇත. දේශපාලන අධිකාරිය වෙනස්වන විට සක්‍රියව ක්‍රියාත්මක වූ ව්‍යාපෘති 368ක් අතුරින් 222ක් නිමවී 146ක් අතරමග නතරවී ඇත.එකක් රු.3,000,000.00ක පිරිවැයකින් ගොඩනැගීමට ඇස්තමේන්තු කළ මෙම අතරමග නතර වූ ව්‍යාපෘති 146හි කටයුතු අනුප්‍රාප්තික දේශපාලන අධිකාරිය ඉදිරියට ගෙන යාම වෙනුවට අතරමග නතරකර දැමීම ගැටළු සහගතය.

... ඉංජිනේරු සංස්ථාව හා රාජ්‍ය සංවර්ධන නීතිගත සංස්ථාව විසින් අතරමග නතර ව්‍යාපෘති 146ට දරණ ලද වියදම අපතේ යෑමක් වන අතර එකී වියදම් ගෙවීමට මධ්‍යම සංස්කෘතික අරමුදලට පැවරෙන වගකීමද බරපතල කාරණයකි.

මෙසේ නිම නොවූ ව්‍යාපෘති 146 හි කටයුතු අනුප්‍රාප්තික දේශපාලන අධිකාරිය ඉදිරියට ගෙන නොයෑම ජාතික සම්පත් අපතේ යැවීමට ඉඩහැරීමක් බව මෙම කමිටුවට කරුණු දිරිපත් වේ.

<u>මධ්‍යම සංස්කෘතික අරමුදල් පනත පිළිබඳ නිරීක්ෂණ</u>

සංස්කෘතික අරමුදල් පනත බිහිවීමට පදනම් වූ තත්වයන් මෙම කමිටුව ඉදිරියේ ප්‍රකාශ ලබා දුන් මහාචාර්ය පී.බී.මණ්ඩාවල මහතා ඇතුළු දැනට අරමුදලේ සේවයේ නියුතු පුරාවිද්‍යාඥයින් කිපදෙනෙකුම තම ප්‍රකාශවලින් අනාවරණය කළෝ ය. 1970 දශකයේ ... යුගයේදී එවකට තිබූ රජයෙන් පුරාවිද්‍යා කැණීම්, පර්යේෂණ හා සංරක්ෂණය සඳහා ... ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන නොලැබී ඇත. එවකට පුරාවිද්‍යා සහකාර අධ්‍යක්ෂවරයෙකු වූ රෝලන්ඩ් සිල්වා මහතා ඒ වනවිට නිරාවරණය කරගෙන තිබූ පුරාවිද්‍යා ස්ථාන නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ගෙන් මුදල් අයකර ගැනීමට අවසර ලබා ගැනීම සඳහා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළද, එවකට සිටි සංචාරක අමාත්‍යවරයාගේ විරෝධතාවය මත එකී ඉල්ලීම ප්‍රතික්ෂේප වී ඇත.

පසුව රෝලන්ඩ් සිල්වා මහතා එවකට ශ්‍රී ලංකාවේ යුනෙස්කෝ කටයුතු භාරව සිටි ආනන්ද ගුරුගේ මහතා සමග සාකච්ඡා කර ඔහු මගින් පුරාවිද්‍යා කැණීම්, සංරක්ෂණ, හා පර්යේෂණ සඳහා යුනෙස්කෝ ආධාර ලබා ගැනීමට කටයුතු කර යුනෙස්කෝ ආධාර සහිතව අරමුදලක් ඇතිකොට පුරාවිද්‍යා පර්යේෂණ කිරීම සඳහා ව්‍යාපෘති හයක් හඳුන්වා දී ඒවා පිහිටි ප්‍රදේශවල පදිංචි ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීමේ අභිලාෂයෙන් කැණීම්, සංරක්ෂණ කටයුතු සඳහා ඔවුන්ගේ ශ්‍රමදායකත්වය ලබා ගනිමින් සංස්කෘතික ත්‍රිකෝණ ව්‍යාපෘතිය පිළිබඳව ආරම්භ කර ඇති බව කමිටුව ඉදිරියේ ප්‍රකාශ ලබා දුන් පුරාවිද්‍යාඥයින්ගේ ප්‍රකාශ මගින් හෙළිවේ. පසුව එකී අරමුදල නීතිගත කිරීම සඳහා මධ්‍යම සංස්කෘතික

රමුදල් පනත හඳුන්වා දී ඇති බවත් මුල් අවධියේ එම අරමුදල මගින් අදාළ ප්‍රදේශයන්හි
හා සහභාගීත්වය ඇතිව පුරාවිද්‍යා කැණීම්, සංරක්ෂණ හා පර්යේෂණ කරමින් පුරාවිද්‍යා
ථාන එම්තා ජාතික උරුමයන් ලෙස ලෝකවාසී ජනතාවගේ යහපත සඳහා නඩත්තු
රමින් පවත්වා ගෙන ගොස් ඇත.

අනුව පනත හඳුන්වාදීමට පෙර එවැනි නෛතික බලයක් නොමැතිව පවත්වාගෙන ගිය
සලු අරමුදල් මධ්‍යම සංස්කෘතික අරමුදලට ඒකාබද්ධ කර ඇත. මින් ප්‍රකට වන්නේ මධ්‍යම
ංස්කෘතික අරමුදල් පනත ආරම්භ කිරීමට පෙර පුරාවිද්‍යා කැණීම්, පර්යේෂණ, සංරක්ෂණ
දහා වියදම් දැරීමට විධිමත් මූල්‍ය සැපයීමේ යාන්ත්‍රණයක් නොමැති වීමේ
හර්ථය(Mischief) මගහරවා ගැනීම සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදල් පනත හඳුන්වා දී
ති බවයි.

අනුව මධ්‍යම සංස්කෘතික අරමුදල් පනත අර්ථ දැක්විය යුත්තේ එහි භාවිතාකර ඇති
වන හුදෙකලාව අර්ථ දැක්වීමෙන් නොව එහි සන්දර්භය හෝ පද අන්වය (Context) තෝරා
බේරා අර්ථ දැක්වීමේ ස්වර්ණමය රීතිය යටතේ බව මනාව තහවුරු වේ. නොඑසේනම්
නත හඳුන්වා දීමේ පරමාර්ථය මුළුමනින්ම විහිළුවක් (Absurdity) බවට පත්වීම
ාවැළැක්විය හැක. විවිධ අවස්ථාවලදී විවිධ පුද්ගලයින් විසින් පනතේ වගන්තිවලට විවිධ
ර්ථ නිරූපණ දෙනබවත් විධිමත් අර්ථ නිරූපණයක් පනත් අර්ථ නිරූපණ
ශේෂඥයින්ගෙන් කිසිදු අවස්ථාවක ලබා ගෙන නොමැති බවත් ප්‍රකාශ වලදී අනාවරණය
ි.

ත්ත්වය මෙසේ තිබියදී පුරාවිද්‍යා ස්ථාන නැරඹීම සඳහා අයකිරීම් ආරම්භ කිරීමත් සමග
රමුදලේ ආදායම ක්‍රමයෙන් වර්ධනය වී ඇත. එසේම මුල් යුගයේදී පුරාවිද්‍යා කටයුතු වලින්
හැර අවශ්‍යතාවයන් සඳහා විශේෂයෙන් විහාරස්ථාන වලින් ඉල්ලීම් ලැබුණ විට එකී
ල්ලීම පිලිබඳ විධිමත් පරීක්ෂණයක් කිරීමෙන් අනතුරුව යම් මුදල් පරිත්‍යාගයන් කර ඇති
ව අරමුදලේ අභ්‍යන්තර විගණකවරයා ප්‍රකාශ කලද, මධ්‍යම සංස්කෘතික අරමුදල් පනතේ
තිපාදන පුළුල් පරාසයක් ආවරණය කරන බැවින් එකී ප්‍රතිපාදන උපයෝගී කරගනිමින්
රමුදල ආරම්භ කිරීමට පදනම් වූ මූලික කරුණු යටපත් වී අනුයාත පරමාර්ථ ඔස්සේ
රමුදල මෙහෙයවීමට පසුකලෙක දේශපාලන අධිකාරිය සමග ඉහල කළමනාකාරිත්වය
ලෙඹී ඇති බව කමිටුව නිරීක්ෂණය කරයි.

ශේෂයෙන් සසුනෝදය සහ සිසු දහම් සෙවණ ව්‍යාපෘති ක්‍රියාත්මක කළ අවධියේදී
රමුදලේ ප්‍රධාන කාර්යාලයේ සේවය කරන ලද නිළධාරීන් මධ්‍යම සංස්කෘතික අරමුදල්
නතේ පූර්විකාව, 4(ඉ) වගන්තිය, සහ 8 වන වගන්තිය ගෙනහැර දක්වමින් අරමුදල මගින්
ම අවධියේ කරන ලද බඳවා ගැනීම, ඉදිකිරීම්, මුදල් යෙදවීම් සම්බන්ධ බලය අරමුදලට
බූ බව කමිටුව ඉදිරියේ ප්‍රකාශ කොට ඇත.

—

නතේ පූර්විකාව -

ශ්‍රී ලංකාවේ සංස්කෘතික සහ ආගමික ස්මාරක සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාව සහ
දේශයන්හි සංස්කෘතික ස්මාරක සංවර්ධනය කිරීමේදී, ප්‍රතිසංස්කරණය කිරීමේදී සහ
ාගමික සහ සංස්කෘතික කටයුතු සංවර්ධනය කිරීමේදී දරන ලද වියදම් පියවීම
සඳහා, කලාකරුවන්ට, ශිල්පීන්ට, ලේඛකයන්ට චිත්‍ර ශිල්පීන්ට, සංගීතඥයන්ට සහ
ංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීමෙහි ලා නිරත වෙනත් තැනැත්තන්ට මුදලින් ආධාර
ලසීම පිණිසද සංස්කෘතික සහ ආගමික ක්ෂේත්‍රයන්හි ජාතිය වෙනුවෙන් සේවය කල

තැනැත්තන්ට ප්‍රදානයන් කිරීම සඳහා ද අරමුදල් ප්‍රතිපාදනය කිරීම සඳහා "මධ්‍යම සංස්කෘතික අරමුදල" යනුවෙන් හඳුන්වන අරමුදලක් පිහිටුවීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි"

අරමුදලේ බලතල යටතේ පනතේ 4(ඉ) වගන්තිය -

"4(ඉ) මේ පනතේ විධිවිධාන වලට යටත්ව අරමුදලේ නිළධරයන් හා සේවකයින් පත් කිරීමට, සේවයේ නියුක්ත කිරීමට, හා ඔවුන්ගේ පාරිශ්‍රමික ගෙවීමට, ස්වකීය සේවානියුක්තයින් පත් කිරීමට, උසස් කිරීම, ඔවුන්ගේ පාරිශ්‍රමික ගෙවීම, ඔවුන්ගේ විනය පාලනය කිරීම හා ඔවුන්ට නිවාඩුදීම හා වෙනත් ප්‍රතිලාභ දීම පිළිබඳ රීති සෑදීමට"........... බලය තිබිය යුතුය.

පනතේ 8 වන වගන්තිය යටතේ අරමුදලේ මුදල් යෙදවිය හැකි පරමාර්ථ -

අරමුදලට අයත් මුදල් ප්‍රධාන වශයෙන්ම පහත දැක්වෙන පරමාර්ථ සඳහා හෝ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන වෙනත් ආකාරයකට හෝ යෙදවීම මණ්ඩලයේ කාර්‍ය විය යුතුය:-

(අ). සංස්කෘතික ත්‍රිකෝණය තුල ඇති සංස්කෘතික ස්මාරක සහ සංස්කෘතික ත්‍රිකෝණය හැර වෙනත් ප්‍රදේශයක ඇත්තාවූ ද මහජන යහපත සඳහා දියුණු කිරීම අවශ්‍ය බව මණ්ඩලය විසින් අදහස් කරනු ලබන්නාවූ ද වෙනත් යම් සංස්කෘතික ස්මාරක සංවර්ධනය කිරීමේදී දරන ලද සියලු වියදම් පියවීමට;

(ආ) ජේතවන දාගැබ යෝජනා ක්‍රමයෙහි සහ වෙනත් ඒ සමාන යෝජනා ක්‍රමයන්හි සියලු වියදම් පියවීමට;

(ඇ) ශ්‍රී ලංකාව ඇතුලත හෝ විදේශයන්හි ආගමික කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා ;

(ඈ) ආගම නංවාලීම සඳහා හෝ ආගමික ස්ථාන හා ආගමික වත්පිළිවෙත් පවත්වා ගෙන යාම සඳහා ;

(ඉ) සංස්කෘතික සහ ආගමික ක්ෂේත්‍රයන්හි ලා ජාතියට සේවය කර ඇත්තාවූ තැනැත්තන්ට ප්‍රදානයන් පිරිනැමීම සඳහා ;

(ඊ) කලාකරුවන්ට ලේඛකයන්ට චිත්‍ර ශිල්පීන්ට සංගීතඥයන්ට මූර්ති ශිල්පීන්ට සහ සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීමෙහි ලා නිරත වෙනත් තැනැත්තන්ට මුදලින් ආධාර සැලසීම සඳහා ; සහ

(උ) මණ්ඩලයේ මතය අනුව මහජනයාට ප්‍රතිලාභයක් හෝ යහපතක් සැලසෙන වෙනත් යම් ආගමික හෝ සංස්කෘතික කාර්‍යයන් සඳහා

පූර්විකාවේ මෙන්ම පනතේ 8 වන වගන්තිය තුලද සඳහන් "ආගමික සහ සංස්කෘතික කටයුතු සංවර්ධනය" මහජන යහපත සඳහා අවශ්‍ය බව මණ්ඩලය අදහස් කරන්නා වූ සංස්කෘතික ස්මාරක සංවර්ධනය" " ආගමික කටයුතු ප්‍රවර්ධනය" " ආගමික හා ආගමික වත්පිළිවෙත් පවත්වාගෙන යෑම" "මහජනයාට ප්‍රතිලාභයක් හෝ යහපතක් සැලසෙන වෙනත් ආගමික හෝ සංස්කෘතික කාර්‍යයන්" යන වාක්‍ය ඛණ්ඩ උපයෝගී කරගනිමින් මෙම පනත නීතිගත කිරීමට පදනම් වූ කරුණු යටපත් කරමින් අරමුදලේ ආදායම ප්‍රධාන වශයෙන් ආගම් ආශ්‍රිත නව ඉදිකිරීම් සඳහා යොදා ගැනීමට පසු කාලීනව අරමුදලේ දේශපාලන අධිකාරිය පෙළඹී ඇති බව නිරීක්ෂණය වේ.

කෙසේ වුවද බෞද්ධාගමිකයින්ගේ අධ්‍යාත්මික හා අධ්‍යාපනික ප්‍රවර්ධනය සඳහා 1990 අංක 35 දරණ බුද්ධශාසන අරමුදල් පනත සහ බෞද්ධ විහාර සහ දේවාලගම් පනත, ඉස්ලාම් භක්තිකයින්ගේ අධ්‍යාත්මික සහ අධ්‍යාපනික ප්‍රවර්ධනය සඳහා 1956 අංක 51 දරණ මුස්ලිම් භාර පනත ( වකුෆ් ) ,කතෝලික, ක්‍රිස්තියානි සහ හින්දූන්ගේ අධ්‍යාත්මික සහ අධ්‍යාපනික ප්‍රවර්ධනය සඳහා පල්ලි සහ කෝවිල් ආශ්‍රිත පුණ්‍යභාර පවතින්නේ වුවද සියලු ආගම්වල සංස්කෘතීන්, ස්පර්ශනීය සහ අස්පර්ශනීය ජාතික උරුමයන් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා පවතින්නේ මධ්‍යම සංස්කෘතික අරමුදල බව මෙම කමිටුවේ නිහතමානී මතය (Humble Opinion) වශයෙන් මෙම අරමුදල මගින් මෙතෙක් කරන ලද ක්‍රියාකාරකම් විවේචනය කිරීමකින් හෝ එම ක්‍රියාවන් අභියෝගයකට ලක් කිරීමකින් තොරව හුදෙක් ඉදිරියේදී පනත යාවත්කාලීන කිරීමකදී හෝ පවතින පනත පරිච්ඡින්න කොට නව පනතක් සම්පාදනය කිරීමේදී සැලකිල්ලට ගැනීම සඳහා පමණක් වාර්තා කර තබමු.

ඉහත සදහන් සවිස්තර ප්‍රකාශ මත පදනම් වූ නිරීක්ෂණ ප්‍රකාරව මෙම කමිටුව වෙත දෙන ලද පැවරුමට පහත පරිදි මෙම කමිටුවේ නිගමන ඉදිරිපත් කරයි.

I. මධ්‍යම සංස්කෘතික අරමුදලේ 209 වන පාලක මණ්ඩලයේ එකඟතාවයට පැමිණ ඇති කරුණු සම්බන්ධව පාලක මණ්ඩල සාමාජිකයන් විසින් යොදා ඇති අත්සන් වල අව්‍යාජභාවය විමසීමට ලක් කිරීම.

**නිගමනය:** මධ්‍යම සංස්කෘතික අරමුදලේ 209 වන පාලක මණ්ඩලයේ එකඟතාවයට පැමිණ ඇති කරුණු සම්බන්ධව පාලක මණ්ඩල සාමාජිකයන් විසින් යොදා ඇති අත්සන් සත්‍ය සහ නිර්ව්‍යාජ අත්සන් බවට සැක කටයුතු ලේඛන පිළිබඳ රජයේ රස පරීක්ෂකවරයාගේ ලබා දී ඇති විශේෂඥ මතය පිළිගැනීමට තීරණය කරයි.

II. එම අත්සන් නොගැලපේ නම් ඒ පිළිබඳව අදාළ පුද්ගලයින් මගින් තහවුරු කර ගැනීම.

III. එම අත්සන් තබන ලද පුද්ගලයින් විසින් දක්වන අදහස් පදනම් කොටගෙන රජයේ රසපරීක්ෂක වෙතින් අත් අකුරු පිළිබඳව විශේෂඥ මතයක් ලබා ගැනීම තුළින් විද්‍යාත්මකව කරුණු සනාථ කරගැනීම.

**නිගමනය:** කමිටුව වෙත ඉදිරිපත් කර ඇති පැවරුමේ II, III විමසීම් වලට පිළිතුරු සැක කටයුතු ලේඛන පිළිබඳ රජයේ රස පරීක්ෂකගේ වාර්තාව මගින් සවිස්තරව ලබා දී ඇත.

IV. 2015-2019 කාලය තුළ ක්‍රියාත්මක කළ ප්‍රධාන ව්‍යාපෘතීන් මොනවදැයි හඳුනා ගැනීම

**නිගමනය:** 2015 වර්ෂයට පෙර සිට ආරම්භ කරන ලද පුරාවිද්‍යා ව්‍යාපෘති අවිච්ඡින්නව පවත්වා ගෙන ගොස් ඇති අතර, සසුනෝදය වැඩසටහන,අතීත ශ්‍රී ලාංකික මහාමාත්‍යාදීන් ආගමික වශයෙන් දේශය උදෙසා සිදුකළ මෙහෙවර, වෙනුවෙන් පුණ්‍යානුමෝදනා වැඩසටහන සහ සිසු දහම් සෙවණ වැඩසටහන ප්‍රධාන ව්‍යාපෘති ලෙස හඳුනාගනී.

V. එසේ හඳුනාගන්නා ප්‍රධාන් ව්‍යාපෘතිවල මූල්‍ය ඵලදායීතාවය හා කාර්යක්ෂමතාවය විමසීම

**නිගමනය:** ඉහත සඳහන් නිරීක්ෂණවල සවිස්තරව දක්වා ඇති පරිදි සසුනෝදය මෙන්ම සිසුදහම් සෙවණ තුන්වන අදියරයන්හි මූල්‍ය ඵලදායීතාවය හා කාර්යක්ෂමතාවය, කළමනාකරණයට පාලනය කළ නොහැකි බාහිර සාධක බලපෑම නිසා මූල්‍ය ඵලදායීතාවය ලඟා කර ගැනීමට නොහැකි වූ බව නිගමනය කරයි.

VI. ස්ථාවර තැන්පතු තැබීම ලබා ගැනීම සාධාරණ ද හා නෛතික ප්‍රතිපාදන මත සිදුකර ඇත්ද යන්න විමසීම.

**නිගමනය:** ඉහත සඳහන් නිරීක්ෂණවල සවිස්තරව දක්වා ඇති පරිදි අරමුදල් ආපසු ගැනීමට වඩා 2015-2019 කාලය තුළ ආයෝජනය කළ ප්‍රමාණය වැඩි බවත් 2019 ස්ථාවර තැන්පතු ප්‍රමාණය රු.මිලියන 6033ක් බවත් අනාවරණය විය.

VII. වියදම් වලට බැඳීම හා ගිවිසුම්ගත වීම සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබා ගැනීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදයන් හි නිරවද්‍යතාව පරීක්ෂා කිරීම.

නිගමනය: ඉහත සඳහන් නිරීක්ෂණවල සවිස්තරව දක්වා ඇති පරිදි වියදම් වලට බැඳීම් හා ගිවිසුම් ගත වීම අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත රාජ්‍ය සංස්ථා සමග සිදු කර ඇති බවත් පාලක මණ්ඩලයේ ආවරණ අනුමැතිත් පසුව අනුමත කර ගෙන ඇති බව නිගමනය කරයි.

VIII. ප්‍රශ්නගත කාලසීමාව තුලදී අරමුදල පනතේ අරමුණින් බැහැරව ක්‍රියා කර ඇද්ද යන්න විමසා බැලීම.

**නිගමනය:** ඉහත සඳහන් නිරීක්ෂණවල සවිස්තරව දක්වා ඇති පරිදි පනතේ මූලික පරමාර්ථ වලින් බැහැරව අනුයාත පරමාර්ථ වලට වැඩි නැඹුරුවක් දක්වා ඇති බව නිගමනය කරන අතර ඉමම තත්වය 2015ට පෙර සිටම පැවතෙන ක්‍රමවේදයක් බව නිගමනය වේ.

IX. ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි හා මූල්‍ය පාලන ක්‍රමවලට අරමුදල අනුගත වී තිබුණේද යන්න විමසා බැලීම.

**නිගමනය:** ඉහත සඳහන් නිරීක්ෂණවල සවිස්තරව දක්වා ඇත.

X. අදාළ කරුණු සම්බන්ධයෙන් චක්‍රලේඛ, මාර්ගෝපදේශ ආදිය නිකුත් වී තිබුණේද යන්න හා ඒවා අනුගමනය කළේද යන්න විමසීම.

**නිගමනය:** ඉහත සඳහන් නිරීක්ෂණවල සවිස්තරව දක්වා ඇති පරිදි චක්‍ර ලේඛ සහ මාර්ගෝපදේශ සහ පසුවිපරම් ක්‍රියාවලියක් සැලසුම් කර තිබුනද සමහර අදියරයන්හිදී ඒවායින් බැහැරව කටයුතු කර ඇති බව නිගමනය කරයි.

XI. ඉහත සඳහන් ප්‍රතිපාදනවලින් බැහැරවූ අවස්ථා ඇත්ද හා ඒ සඳහා අවස්ථාවෝචිත පරිදි අමාත්‍ය මණ්ඩලයේ හෝ පාලක මණ්ඩලයේ අනුමැතිය ලබා ගත්තේ දැයි විමසා බැලීම.

**නිගමනය:** ඉහත සඳහන් නිරීක්ෂණවල සවිස්තරව දක්වා ඇත

XII. පාලක මණ්ඩල රැස්වීම්වල විධිමත්භාවය අනාවරණය කර ගැනීම හා එහි තීරණ අනුමත කරවා ගැනීම

**නිගමනය:** ඉහත සඳහන් නිරීක්ෂණවල සවිස්තරව දක්වා ඇත

XIII. විමර්ශන වාර්තාවෙන් හෙළිදරව් වන කරුණු මත චෝදනා ලබන නිලධාරීන් සිටීද?

**නිගමනය:** 2015-2019 කාලය තුළදී එවකට සේවයේ නියුක්තව සිටි නිලධාරීන් විසින් මූල්‍ය වංචාවක් සිදු කළ බවට කරුණු හෙළිදරව් වී නොමැති බවට එම කාලය තුළදී මධ්‍යම සංස්කෘතික අරමුදල් පනතේ විධිවිධාන වල සරල වචනාර්ථය මත පිහිටා ඒ මත අරමුදලේ කටයුතු ක්‍රියාත්මක කිරීම සහ/හෝ පාලක මණ්ඩලයේ රැස්වීම් නිශ්චිත කාල රාමුවක් තුළ නිතිපතා පැවැත්වීමේ ප්‍රායෝගික අපහසුතාවය නිසා නිසි කළමනාකරණයකට යෝග්‍ය නොවන මූල්‍ය සහ පරිපාලන පරිචයන් ඇති කර ගැනීම සහ /හෝ අරමුදලට සෘජුව වග කියන ස්ථිර ඉහළ කළමනාකාරීත්වයක් දීර්ඝ කාලයක් තිස්සේ නොසිටීම නිසා ප්‍රතිඵලය වූ ආරාජිකභාවය හේතු කොට ගෙන එම කාලය තුළ පහත සඳහන් අවිධිමත් ක්‍රියා සිදු වී ඇති බව නිගමනය කරමු.

1. කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව පරිපාලන ඒකකයක් ස්ථාපිත කොට ඒ සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, සහ ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම සහ එම ඒකකය සඳහා පරිපාලන වියදම් දැරීම

2. කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව වැටුප් ක්‍රමයකට නිලධාරීන් බඳවා ගැනීම

3. මුදල් රෙගුලාසි වලට පටහැනිව ඇස්තමේන්තුගත සම්පූර්ණ මුදල කාර්‍ය ආරම්භ කිරීමට ප්‍රථම සසුනෝදය වැඩසටහන යටතේ ගෙවීම් කිරීම

4. රාජ රාජ මහාමාත්‍යාදීන් බුද්ධ ශාසනය වෙනුවෙන් කළ මෙහෙවරට පුණ්‍යානුමෝදනා කිරීම සඳහා පාලක මණ්ඩල පූර්ව හෝ ආවරණ අනුමැතියකින් තොරව අරමුදලේ මුදල් වැය කිරීම.

5. මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් පාරිශ්‍රමික ගෙවන සේවකයින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සඳහා බඳවා ගැනීම.

6. සසුනෝදය ව්‍යාපෘතියේ අඩුපාඩුකම් සොයා බලා විධිමත්ව නියාමනය කරමින් පවත්වා ගෙන යාම වෙනුවට එය සම්පූර්ණයෙන් නවතා දැමීමෙන් අපේක්ෂිත මහජන යහපතට අගතිදායක තත්ත්වයන් නිර්මාණය වීම.

7. නියෝගය දුන් නිලධාරියාගේ නිල නාමය හෝ පුද්ගල නාමය සඳහන් නොකර මුදල් අමාත්‍යංශය මගින් මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රාග්ධන වියදම් අත්හිටුවීම සඳහා වගකීම් විරහිත ලිපියක් නිකුත් කිරීම මගින් සිසු දහම් සෙවණ ව්‍යාපෘතිය සඳහා දෙමින් සිටි මූල්‍ය ප්‍රතිපාදන නවත්වා එතෙක් කරන ලද වියදම් නාස්තියක් බවට පත්වීමට ඉඩ සැලසීම.

- ඉහත සඳහන් වැරදි සම්බන්ධයෙන් 2015-2019 අතර කාලපරිච්ඡේදය තුළ සේවය කළ අධ්‍යක්ෂ ජනරාල් ප්‍රිශාන්ත ගුණවර්ධන මහතාටද, එම කාලසීමාවේ අධ්‍යක්ෂ මුදල් (වැ.අ) මරදාන ගමගේ ආරියරත්න මහතාටද මාස 11 පමණ කාලයක් තුළ ප්‍රධාන පරිපාලන නිලධාරි ලෙස කටයුතු කළ කුලකුලසූරිය පටබැදිආරච්චිරාලලාගේ බර්නාඩ් වසන්ත මහතාටද, අමාත්‍යංශ ප්‍රධාන මූල්‍ය නිලධාරි වටුතන්ත්‍රිගේ අරුණසිරි ද අල්විස් මහතාටද එම අවිධිමත් ක්‍රියාමාර්ග නිවැරදි කිරීමට පියවර නොගැනීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ ii කාණ්ඩයේ රජයේ නිලධාරීන් විසින් සිදුකළ වරදවල් සම්බන්ධයෙන් පළමුවන උපලේඛනයේ සඳහන් වැරදි අතුරින් 15 වගන්තිය සහ 16 වගන්තිය කඩ කිරීම සම්බන්ධයෙන් චෝදනා පත්‍ර නිකුත් කිරීමට තරම් ප්‍රමාණවත් කරුණු අනාවරණය වී ඇති නමුත් මේ වන විට ඔවුන් සියලු දෙනාම රජයේ සේවයෙන් විශ්‍රාම ගොස් ඇති බැවින් සහ සංස්ථා සේවයෙන් ඉවත්ව ඇති බැවින් ඔවුන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා ප්‍රතිපාදන නොමැති බවද කමිටුව තීරණය කරයි.

කමිටුවේ නිර්දේශ

ඉහත සදහන් ප්‍රකාශකරුවන්ගේ ප්‍රකාශ වලින් හා කමිටුව වෙත ඉදිරිපත් වූ ලේඛනමය සාක්ෂි ඇසුරෙන් සිදු කළ ගැඹුරු අධ්‍යයනයකින් පසු පහත සදහන් නිර්දේශ කමිටුව ඉදිරිපත් කරයි.

1. වැඩ අධ්‍යයනයකින් අනතුරුව තනතුරු ඇති කර ගැනීම.

වැඩ අධ්‍යයනයක් සිදුකොට අවශ්‍ය කාර්‍යමණ්ඩලය සදහා දැනට ප්‍රමාණවත් වැඩ පවතී ද යන්න විශ්ලේෂණය කොට පුරප්පාඩු පවතීනම් විධිමත්ව කළමනාකරණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව තනතුරු අනුමත කරවා ගැනීම.

2. බඳවා ගැනීමේ පරිපාටි අනුමත කර ගැනීම :-

බඳවා ගැනීමේ පටිපාටි අනුමත කර නොගෙන සේවයේ නියුක්ත කරවා ගෙන සිටින තනතුරු සඳහා , කළමනාකරණය අරමුදලේ ක්‍රියාකාරිත්වයට අවශ්‍යයැයි සලකන වෙනත් තනතුරු රාජ්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුවෙන් අනුමත කරගෙන එකී තනතුරු සඳහාද බඳවා ගැනීම් පටිපාටි අනුමත කර ගැනීමට නොපමාව පියවර ගත යුතු බව

3. පුරප්පාඩු පිරවීම සහ අවශ්‍ය නම් බඳවා ගැනීමේ පටිපාටි සංශෝධනය කිරීම.

වැඩ බලන, වැඩ ආවරණ, රාජකාරි ඉටු කරන, හා කොන්ත්‍රාත් පදනම මත, සේවයේ යොදවා සිටින තනතුරු සඳහා අනුමත බඳවා ගැනීමේ පටිපාටියක සුදුසුකම් අනුව පුරප්පාඩු පිරවීමට ක්‍රියාමාර්ග ගත යුතු අතර අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ සුදුසුකම් අනුව නිළධාරීන් බඳවා ගැනීමේ උත්සහය අසාර්ථක නම් බඳවා ගැනීමේ පටිපාටියේ අවශ්‍ය සංශෝධන සිදුකර ඒ අනුව පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතු බව

4. පාලක මණ්ඩල සංයුතිය වෙනස් කිරීම

අරමුදලේ කටයුතු වලට බලය ලබා දෙන පාලක මණ්ඩලය එහි සංයුතිය අනුව රැස්කිරීමේ අපහසුතාවයන් පවතින බැවින් එය අරමුදලේ සමස්ත පාලනය බිඳ වැටීමට හේතු වී ඇති කරුණක්ව පවතින බැවින් අරමුදලේ අවශ්‍යතාවය පරිදි කාල සටහනකට අනුව පාලක මණ්ඩලය රැස්කර ගතහැකි අයුරින් එහි සංයුතියේ වෙනස් කිරීම් සහ/හෝ නව පාලන ව්‍යුහයක් සකසා ගැනීම සඳහා ක්‍රියා කලයුතු බව

5. වැඩ සටහන් නිවැරදිව කළමනාකරණය කිරීම

වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී,

අ. පූර්ව අනුමැතිය ලබා ගැනීම

ආ. මනාව සැලසුම් කිරීම

ඇ. මනා පසු විපරම් ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම

ඈ. අරමුණු සහ ඉලක්කවලට ලඟා වන තෙක් අඛණ්ඩ පැවැත්මකින් රජයේ මූල්‍ය රෙගුලාසි සහ ප්‍රසම්පාදන උපදෙස් ප්‍රකාරව වැඩසටහන් ක්‍රියාවට නැංවීම.

යන කරුණු වලට අනුකූල වෙමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතු බව

6. පවතින රෙගුලාසිවලට අවනත වීම-

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි අනුගමනයට මධ්‍යම සංස්කෘතික අරමුදල යටත් වන බව අරමුදල වෙත දැනුම් දිය යුතුය.

7. රීති සහ කාර්ය සංග්‍රහයක් සකස් කිරීම-

1957 අංක 49 දරණ රාජ්‍ය කර්මාන්ත සංස්ථා පනත යටතේ විධිවිධාන සලසා ඇති පරිදි මධ්‍යම සංස්කෘතික අරමුදලේ අවශ්‍යතාවයන්ටද ගැලපෙන පරිදි විනය කාර්‍යපටිපාටි සහ මුදල් රෙගුලාසි ඇතුලත් කාර්‍යසංග්‍රහයක් සකස් කර ගැනීමට උපදෙස් දීම.

8. අඛණ්ඩ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම

කාර්‍ය මණ්ඩලය ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි පිළිබඳව අඩු අවබෝධයකින් ක්‍රියාත්මක වන බවට කරුණු හෙළි වී ඇති බැවින් රාජ්‍ය ප්‍රතිපත්ති ආයතන සංග්‍රහය සහ [illegible]දල් රෙගුලාසි පිළිබඳ විෂයයන් ඇතුලත් කොට සුදුසු පුහුණු වැඩසටහන් මගින් [illegible]වකයින්ට කාලානුරූපීව පුහුණුව ලබා දීම

9. රැකියා අභිවෘද්ධිය ඇති කිරීම

බඳවා ගැනීම සහ රඳවා ගැනීම සම්බන්ධයෙන් නිසි අවධානයක් යොමු කරමින් රැකියාව තුල වෘත්තීය අපේක්ශාව සහ දියුණුව ඇති වන පරිදි බඳවා ගැනීම් පටිපාටි සකස් කර ගන්නා ලෙස අරමුදලට දැන්වීම

10. ප්‍රජා පාදක ප්‍රවේශය හඳුන්වා දීම

අරමුදල විසින් ක්‍රියාත්මක කරන කැණීම්, සංරක්ෂණ, සහ වෙනත් දීපව්‍යාප්ත වැඩසටහන් වලදී ප්‍රජා පාදක ප්‍රවේශය හඳුන්වා දීම තුලින් ඔවුන්ගේ ජීවන තත්වය නගා සිටුවීම මෙන්ම ව්‍යාපෘති වල තිරසාරභාවය ද ආරක්ෂා වන පරිදි වැඩසටහන් සංවිධානය පිණිස අරමුදලට උපදෙස් දීම

11. පාලක මණ්ඩලයේ ව්‍යුහාත්මක වෙනස්කම් ඇති කිරීම

[illegible]යම සංස්කෘතික අරමුදලේ පාලක මණ්ඩලයේ ප්‍රායෝගික නොවන සංයුතිය හේතු [illegible]ට ගෙන උද්ගතව ඇති අර්බුදකාරි තත්වය මගහැරීම සඳහා පාලක මණ්ඩලය අහෝසි කොට රජයේ අනෙකුත් සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල කළමනාකාරිත්වයේ සංයුතිය අධ්‍යයනය කොට, සභාපති, අධ්‍යක්ෂ ජනරාල් ඇතුලු අධ්‍යක්ෂ මණ්ඩලයක් [illegible]ත්කර එකී අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්‍ය සහ කර්තව්‍යයන් පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවක් මගින් අඛණ්ඩ අධීක්ෂණය වන පරිදි මධ්‍යම සංස්කෘතික අරමුදල් පනත පරිච්ඡින්න කොට නව පනතක් හඳුන්වා දීම හෝ පවතින පනත සංශෝධනය කිරීම

2. පනත සම්බන්ධ සමාලෝචනයක් සිදු කිරීම

මධ්‍යම සංස්කෘතික අරමුදල් පනතේ දැනට පවතින ප්‍රතිපාදන අවභාවිත කිරීමේ [illegible]වණතාවයක් නිරීක්ෂණය වී ඇති බැවින් පනත සම්බන්ධයෙන් නිසි අධ්‍යයනයක් කර [illegible]නත පරිච්ඡින්න කොට නව පනතක් හඳුන්වා දීම හෝ පවතින පනත මෙම කමිටුවේ [illegible]රීක්ෂණ සැලකිල්ලට ගනිමින් අවශ්‍ය සංශෝධන හඳුන්වා දීම

13. <u>ප්‍රජාව දැනුවත් කිරීම</u>

මධ්‍යම සංස්කෘතික අරමුදලේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ජනමාධ්‍ය සහ අන්තර්ජාලය මගින් ප්‍රචාරණයක් ලබාදීමෙන් මහජනතාව දැනුවත් කිරීමේ වැඩපිළිවෙලක් හඳුන්වා දීමට අරමුදලට උපදෙස් දීම

14. <u>නව තාක්ෂණය හඳුන්වා දීම</u>

ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම ප්‍රධාන කාර්යාලය මගින් නව තාක්ෂණය යොදා ගනිමින් එසැනින් අධීක්ෂණය කළ හැකි වන පරිදි ජාල ගත කිරීම

15. <u>අභ්‍යන්තර විගණන අංශය සවි බල කිරීම</u>

අරමුදලේ අභ්‍යන්තර විගණන අංශය ප්‍රධාන පරිපාලන නිලධාරියාගේ සෘජු අධීක්ෂණය යටත්කොට තවදුරටත් ශක්තිමත් කොට අභ්‍යන්තර පාලන ක්‍රම සවිබල ගැන්වීම.

16. <u>ශ.දු.අ.ත (SWOT) විශ්ලේෂණය.</u>

මධ්‍යම සංස්කෘතික අරමුදල පිළිබඳ ශ්‍රී ලංකා සංවර්ධන ප්‍රධාන පරිපාලන ආයතනය හෝ වෙනත් සුදුසු ආයතනයක් හරහා SWOT විශ්ලේෂණයක් සිදු කොට ඉන් අනාවරණය වන කරුණු මත කෙරෙන නිර්දේශ ඇසුරින් කාර්යය මණ්ඩලයේ සහභාගීත්වයෙන් ක්‍රියාකාරී සැලැස්මක් සකස්කොට ක්‍රියාත්මක කිරීම.

17. <u>ආදායම් කළමනාකරණය</u>

මධ්‍යම සංස්කෘතික අරමුදලේ වාර්ෂික ආදායමෙන් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමෙන් පසු ඉතිරි මුදලින් 75% ක් සංස්කෘතික සහ පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති ජාතික උරුමයන්,කැණීම්, සංරක්ෂණ සහ නඩත්තු කටයුතු වෙනුවෙන් වෙන්කොට සිදුකොට අනාගත පරපුර වෙනුවෙන් පවත්වා ගෙන යාමට වෙන් කිරීම.

18. <u>තිරසර පැවැත්ම</u>

යම් හෙයකින් මධ්‍යම සංස්කෘතික අරමුදලේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් තවදුරටත් විමර්ශනය කිරීමට අවශ්‍ය යැයි තීරණය කරන්නේ නම් එය දීර්ඝ කාලයක් ආවරණය වන පරිදි වූ ව්‍යවහාරික විගණනයක් මගින් අනාවරණය වන කරුණු මත අවශ්‍ය පියවර ගත යුතු බවට නිර්දේශ කරමු.

24/07/2023

විමර්ශන කමිටුව සභාපති
යූ.ජී.ඩබ්.කේ.ඩබ්.ජිනදාස
විශ්‍රාමික මහාධිකරණ විනිසුරු

24/07/2023
විමර්ශන කමිටුව සාමාජික
ඩබ්.පී.ගුණපාල
ශ්‍රී ලං.ප.සේ 1 ශ්‍රේණිය (විශ්‍රාමික)

24/07/2023
විමර්ශන කමිටුව සාමාජික
එම්.බී වීරකෝන්
ශ්‍රී ලං.ග.සේ 1 ශ්‍රේණිය (විශ්‍රාමික)